# නිහාල් ශ්‍රී අමරසේකර

**බහුඅංගික වෘත්තිය උපදේශකයෙක් සහ වංචාව හා දූෂණයට එරෙහිව සටන් වදින, නීතියේ ආධිපත්‍යය හා යහ පාලනය අගයන, මහජන උන්නතිය වෙනුවෙන් අධිකරණ බලය පතන්නෙක්**



### විද්‍යාලයීය අධ්‍යාපනය

නිහාල් ශ්‍රී අමරසේකර, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෞද්ගලික පාසලක් වන ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයකු වූ අතර, එහිදී ඔහු විද්‍යාලයීය ශිෂ්‍ය නායකයෙක් මෙන්ම, ඉංග්‍රීසි හා සිංහල විවාද කණ්ඩායම් නායකයෙක් ලෙසද කටයුතු කර ඇති අතර, විෂය-බාහිර ක්‍රියාකාරකම් වලදී ද කැපී පෙනෙන ශිෂ්‍යයකු විය. ඉංග්‍රීසි සහ සිංහල සාහිත්‍ය සමිතිවල සභාපති වූ හෙතෙම, රයිපල් වෙඩි තැබීමේ විශිෂ්ඨ දක්ෂයෙකුද විය. තවද ඉන්ටගල් යෝගා (Integral Yoga) සංවිධානයේ ශ්‍රී ස්වාමි සච්තානන්දගේ ශිෂ්‍යයකු ලෙස හත යෝගා ආසන කිරීමේ දක්ෂයෙකුද විය. ඔහුගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය තෙක්, සේවක මණ්ඩලික ඉගැන්වීමේ සමාජිකයෙකු ලෙස, පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන්ගේ පන්තිවල ඉගැන්වීම් කටයුතු වල නිරත වූවේය.

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගණිතය හා ආර්ථික විද්‍යාව සඳහා වූ උපාධිය හැදෑරීමට ඇතුළත් වීමට ඔහුට අවස්ථාව ලැබුනද, ශාස්ත්‍රීය අධ්‍යාපනය වෙනුවට වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට ඔහු තීරණය කළේය. මෙසේ වෘත්තීමය ගණකාධිකරණය තෝරාගත් ඔහු එහි ඉගෙනීම් කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා අර්න්ස් ඇන්ඩ් යන්ග් (එවකට ටර්කන්ඩ් යන්ග්ස්) වරලත් ගණකාධිවරුන් යටතේ ඉගෙනීමට බැඳුනි. එහිදි විගණනය හා බදුකරණය පිළිබඳ පුහුණුවක් ලැබූ අතර, කළමනාකරණ උපදේශකත්වය හා ගවේෂණ ගණකාධිකරණය සම්බන්ධව විශේෂිත දැනුමක් ද ලබා ගත්තේය. ඔහු ඉන්දියාවේ බොම්බාය නගරයේදී ඉදිකිරීම් හා නිෂ්පාදන ආයතනවල මෙන්ම, දත්ත සකස් කිරීම හා පරිගණකකරණය පිළිබඳ පුහුණුවද ලැබීය.

### වෘත්තිය අධ්‍යාපනය


ටර්කන්ඩ් යන්ග්ස් හි සිටියදී, වරලත් ගණකාධිකාරි ශිෂ්‍යයන්ගේ සංසදයේ සභාපති වශයෙන් තේරී පත් වූ ඔහු, එම කාලයේ දී සියලුම ගණකාධිකරණ ආයතන වල ආධුනික ශිෂ්‍යයන් සඳහා නියමිත දීමනාවක් ලබා දීමට ද, නියමිත කාර්ය කාලයක් හා අධ්‍යයන නිවාඩු ලබාදීම හඳුන්වාදීමටද, වගකීමකින් යුක්තව කටයුතු කළේය.

හොඳම කාර්ය සාධනය සඳහා වූ ප්‍රදානය මෙන්ම, කුසලතාවය සඳහා සහතිකයක්ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයෙන් ලබා ගනිමින්, 1974 වර්ෂයේදී ඔහු තම වෘත්තීය විභාග සම්පූර්ණ කළේය. ඒ සමඟම නියමිත සියලු විභාග සම්පූර්ණ කරමින්, එක්සත් රාජධානියේ වරලත් කළමණාකාරිත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීමටද සුදුසුකම් ලැබීය. 1975 වර්ෂයේදී, ශ්‍රී ලංකා රජය විසින් ඔහුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතන මණ්ඩලයේ (Council ) සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය.

අමරසේකර කළමණාකාරිත්වය පිළිබඳ සුප්‍රසිද්ධ කථිකාචාර්යවරයෙකු වූ අතර, ඔහුගේම ආයතනයක් පවත්වාගෙන යමින් 1970 දශකයේ මැද භාගයේදී වෘත්තීමය කළමණාකරණය, ගණකාධිකරණය හා බැංකු විභාග යනාදී විභාග සඳහාද පන්ති පැවැත්වීය. එම කාලය තුළ ඔහු විසින් වරලත් ගණකාධිකාරි ආයතනයේ කළමණාකරණය පිළිබඳව දේශනයන්හිද නිරත විය.

පසුව ඔහුගේ වෘත්තීමය සේවා කාලය තුළ, ඔහු ඕස්ට්‍රේලියාවේ සම්මාණනීය වරලත් කළමණාකාරිත්ව ගණකාධිකාරි ආයතනයේ සාමාජිකයෙකු වූ අතර, ඇමරිකා එක්සත් ජනපදයේ සහතික කළ වංචා විභාගකරුවන්ගේ අයතනයේ සාමාජිකයෙක් වීමටද ආරාධනා ලැබීය. එමෙන්ම, ඔහු ඇමරිකානු නීතිඥ සංගමයේ සහායක සාමාජිකයෙකු වූ අතර, එම සංගමයේ ගෝලීය දූෂණ විරෝධී බලකායේ සාමාජිකයෙකුද විය. ඔහු වෘත්තීමය විෂයයන් පිළිබඳව සුප්‍රකට දේශකයෙක් වූ අතර, සමාජයේ දක්ෂ කථිකයෙක්ද, විද්‍යුත් මාධ්‍යයේ සජීවී වැඩසටහන් වල සාර්ථක ලෙස නිරත වන්නෙක්ද විය.






## වෘත්තිදාරයෙකු ලෙස ක්‍රියා කිරීම

1974 වර්ෂයේ වෘත්තීයමය සේවාව ආරම්භ කිරීමත් සමගම, ඔහුට විශාල දේශීය හා විදේශීය සේවාදායක පිරිසක් ලැබුනු අතර, එමගින් පෞද්ගලික හා රාජ්‍ය අංශවල කළමණාකාරිත්ව උපදේශකත්ව මෙන්ම, ව්‍යාපාර උපදේශකත්ව නොඅඩුව ලැබුනි. ඔහුගේ වෘත්තීය සේවා කටයුතු 'සී/ස කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් සමාගම' සංයුක්ත නාමය යටතේ සිදු කෙරිණි. පසුව එම සමාගම 'Consultants 21 Ltd' යනුවෙන් නම් කරනු ලැබීය.

එම කාලය තුළදීම දිවයින පුරා විගණනය හා බදුකරණය සම්බන්ධව සේවා ග්‍රාහකයින් විශාල ප්‍රමාණයක් ඔහුට සිටි අතර, 1982 දී ඔවුන් සියලු දෙනාම වරලත් ගණකාධිකාරීන් වූ KPMG Ford, Rhodes, Thornton & Co. සමාගමට මාරු කරන ලද්දේ, ඔහු වඩාත් ප්‍රිය කළ ව්‍යාපරික සහ කළමණාකාරිත්ව උපදේශක සේවයට කැපවීම සිය අරමුණ කර ගනිමිනි.

1977 වර්ෂයේදී, ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින්ම අමරසේකරව ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කල අතර, 1980 වර්ෂයේදී ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින්ම ඔහුව දීප ව්‍යාප්ත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල මුල්‍ය කළමණාකරණය කිරීම සඳහා, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩලයකට පත් කලේ ස්වේච්ඡාවෙන් සේවා ලබාදීමේ පදනම මතය. මෙම කාර්යය මැනවින් ඉටුකිරීම හේතු කොට ගෙන, මෙරටට පැමිණි ජාත්‍යන්තර ඇගැයීමේ දූත මණ්ඩල විසින් ඔහුගේ කාර්ය සාධනය හැකියාවන් මහත් ප්‍රශංසාවට ලක් කරනු ලැබීය. රාජ්‍ය සංස්ථා ගණනාවකම අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කළ ඔහු, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මණ්ඩල (Council) සාමාජිකයෙකු ලෙසද සේවාවන් ඉටු කලේය.

1983 වර්ෂයේදී, ඔහු හොටෙල් ඩිවෙලපර්ස් ලංකා පෞද්ගලික සමාගමෙහි [Hotel Developers (Lanka) PLC] ප්‍රවර්ධකයෙකු, ග්‍රාහකයෙකු, අධ්‍යක්‍ෂවරයෙකු හා කොටස්කරුවෙකු ද විය. මෙමඟින් 1987 දී කොළඹදී විවෘත කරන ලද හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය සංවර්ධනය සිදු විය. ඔහු 1983-84 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විශිෂ්ට තරුණයින් දස දෙනා අතරින් ව්‍යාපාර කළමනාකරණය සඳහා පිදුම් ලැබීය.

එමෙන්ම 1989 සිට 1994 දක්වා, ජනාධිපතිවරුන්ව සිටි ආර්. ප්‍රේමදාස හා ඩී.බී. විජේතුංගගේ පාලන සමය තුළ, ඔහුව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සහ ගමනාගමන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අනුශාසක උපදේශකයෙකු ලෙස සේවය කිරීමට බඳවා ගන්නා ලදී. එම සේවය පෞද්ගලීකරණය සඳහා ලෝක බැංකුවත්, USAID ආයතනයේත් මූල්‍ය පහසුකම් සැපයූ ව්‍යාපෘති ගැන අධ්‍යනයක් කර, අන්‍යෝන්‍යව රාජ්‍ය පෞද්ගලික අංශ ඒකාබද්ධව ඇති කරගත්, හවුල් ව්‍යාපාරවල ඵලදායිතා අභිලාශය මත සිදුකිරීමටය.

තවද, මෙහිදී රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණයට ලක් කරමින්, යටිතල පහසුකම් සංවර්ධනය සහ ආයෝජනයේදී, රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් වී ක්‍රියා කිරීමෙන් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමේ චේතනාවෙන් අධ්‍යයනයන් සිදු කරන ලද අතර, එම ආයතනික කර්තව්‍යයන් සිදුකිරීම සඳහා සහ එම ව්‍යාපෘතීන්ට දීර්ඝ කාලීන මූල්‍ය ආධාර සැපයීමට වෙනම කාර්යාලයක් පැවැත්වීමේ අවශ්‍යතාවය මත, ඒ සඳහා වෙනම රාජ්‍ය නියෝජිත ආයතනයක් ස්ථාපනය කරන ලදී. ඔහුගේ උපදේශකත්ව සමාගම සහ එක්සත් ජනපදයේ වොෂිටන් හි පිහිටි උපදේශකත්ව සමාගමක් එහි සේවා කටයුතු ඒකාබද්ධව සිදුකරන ලදී.

1994 වර්ෂයේදී, ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදේශක ලෙස අමරසේකර පත්කරන ලදි. ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් නැවතත් 2004 වර්ෂයේදි රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස සහ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ සභාපති ලෙසද අමරසේකරව පත් කරනු ලැබීය.

ඔහු ඇමරිකාවේ පිහිටි රාජ්‍ය මුල්‍ය කළමණාකාරිත්ව ජාත්‍යන්තර මූල්‍යායතන සමූහයේ 2014/ 2015 වර්ෂ වල මාණ්ඩලික සාමාජිකයෙකු වූ අතර, දූෂණ විරෝධි අධිකාරීන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAACA) 2006 වර්ෂයේ පිහිටවූ දින සිටම සමාජිකයෙකු වූ අතර, එම සංගමය දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCAC) ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) සහභාගිත්වයෙන්, ස්ථාපිත කරනු ලැබූ ජත්‍යාන්තර අයතනයකි. වසර 2011 දී IAACA සංවිධානයේ අනාගත සැලසුම් සැකසිමට 'විශේෂඥ මණ්ඩලයේ' සාමාජිකයෙකු ලෙස ඔහුව පත් කර ගන්නා ලදි."







ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ කිහිපයකදීම අමරසේකර, දූෂණයට සහ වංචාවට එරෙහිව මහජන අයිතින් මත කැපවීමෙන් ක්‍රියාකාරී වී ඇත. මහජන සුබසිද්ධින් හා අයිතින් සහ වෘත්තීයමය මාතෘකා ගණනාවක් පිළිබඳ දේශීය හා විදේශීය වශයෙන් සාර්ථක කථිකයකු වන අමරසේකර, ජාතික සහ මහජන ගැටලු පිළිබඳ මැදිහත් වෙමින් ශ්‍රී ලංකා රජයේ රූපවාහිනිය හරහා 'ඇස් ඇරීමේ - කතා මාලාව' ('Eye Opener - Talk Show') යනුවෙන් රූපවාහිනී වැඩසටහන් ඔහු පැවැත්වුවේය.


## 2007 අංක 7 සමාගම් පනත

2004 වසරේ සිට අමරසේකර ශ්‍රී ලංකා සමාගම් නීති උපදේශක කමිටුවේ සාමාජිකයෙක් වශයෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නීතිගත කිරීමට නියමිතව තිබුන 2007 අංක 7 සමාගම් පනත සකස් කිරීමේ වගකිව යුත්තෙක් සේ ක්‍රියා කරමින්, නව දියුණු රටවල පවත්නා එවන් නීති වලට සමගාමී වන සේ, අවසානයේදී නීති සකස් කළ අතර, සමාගම් කොටස් හිමියකුට ව්‍යුත්පන්න නඩු පැවරීමේ අයිතියද, එහි ව්‍යවස්ථාපිත අයිතියක් ලෙස අඩංගු කර ඇත.




## ගාවේෂණ මත අධිකරණමය බලය පැතිම සහ ජාත්‍යන්තර කතෘවරයෙක් විම

## ව්‍යුත්පන්න නඩු





➤ ඔහු නඩු පැවරීමේ ක්ෂේත්‍රයට පිවිසියේ 1990 වර්ෂයේදීය. එය ඇරඹුනේ කොළඹ හිල්ටන් හෝටලය ගොඩනැගීමේදී ඊට සම්බන්ධ සමාගම් ලෙස ජපානයේ සී/ස මිට්සුයි සහ සමාගම, ටයිසෙයි කෝපරේෂන්, ගෘහ නිර්මාණ ශිල්පීන් වන කැන්කෝ කිකාකු සෙක්කෙයිෂා යෝෂෝ ෂිබාටා ද වූ අතර, එම ගොඩනැගීමේදී වංචාවක් සිදු වී ඇතැයි අමරසේකර විසින් සොයා ගැනීමෙන් පසුවය. HDL සමාගමේ කොටස්කරුවෙකු මෙන්ම එහි අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද, HDL සමාගමට හා ඊට අයිති කොළඹ හිල්ටන් හෝටලය වෙනුවෙන් 'වැරදි කරුවන් පාලනය කිරීම' පදනම මත ශ්‍රී ලංකාවේ පළමුවෙනි වරට ව්‍යුත්පන්න නඩුවක් පවරන ලදී. මෙම පුරෝගාමී

නඩුකරය පැවරුවේ HDL සමාගම මෙන්ම එම සමාගමට ඇපකරු ලෙස ක්‍රියා කළ ශ්‍රී ලංකා රජයට ද, මෙම ජපන් සමාගම් වංචනිකව ක්‍රියා කර ඇතැයි යන පදනම මතය. අමරසේකර විසින්, මෙම නඩුව සඳහා ශ්‍රී ලංකාවේ සුප්‍රකට රාජ්‍ය නීතිඥ පී. නවරත්නරාජා, ජනාධිපති නීතිඥයින් වන එච්.එල්. ද සිල්වා හා කේ. කනග්-ඊශ්වරන්ගේ සේවා ලබා ගන්නා ලදී. පසුව මේ සම්බන්දව, 'කොළඹ හිල්ටන් හෝටලය නිර්මාණය - ශ්‍රී ලංකා රජයට වංචා කිරීම' යනුවෙන් කෘතියක්ද ඔහු විසින් පල කර ඇත. - ***කොළඹ හිල්ටන් හෝටලය ගොඩනැංවීම - ශ්‍රී ලංකා රජයට කළ වංචාව -වෙළුම 01 -ශ්‍රී ලංකාවේ පළමුවෙනි නීතියෙන් නැවත පැණ නැගීම***

- පසුව 1991 වර්ෂයේදී, එවැනි තවත් ව්‍යුත්පන්න නඩුවක් තවදුරටත් ඔහු විසින් පවරන්නට හේතු වූයේ, HDL සමාගමේ විගණනය කළ ගිණුම්, එම ගිණුම් සහතික කළ HDL හි විගණනකරුවන් වන KPMG ෆෝඩ් රෝඩ්ස් තෝන්ටර්න් සමාගම, HDL සමාගමෙහි අධ්‍යක්ෂයින් සමඟ හවුල්ව, HDL සමාගමට, එහි කොටස්කරුවන්ට හා ශ්‍රී ලංකා රජයට කළ වංචනික ක්‍රියා වසන් කිරීමට තැත් කිරීම සම්බන්ධවය. අවසානයේ දී, මුලින් සඳහන් කළ නඩුව සමතයකට පත්කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ වානිජ්‍ය මහාධිකරණය වරලත් ගණකාධිකාරින් වන KPMG ෆෝඩ් රෝඩ්ස් තෝන්ටර්න් සහ සමාගම, HDL සමාගමේ විගණක ධූරයෙන් ඉවත් කිරීමටත්, නව විගණන සමාගමක් පත් කොට, එම ගිණුම් නැවත නව විගණන සමාගම ලවා විගණනය කිරීමටත් තීන්දුවක් දී ඇත.

- ඉහත කී පළමු නඩුවේදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ දුන් ඓතිහාසික නඩු තීන්දුව, 1992 පොදු රාජ්‍ය මණ්ඩල (වානිජ) නීති වාර්තාවන්හි වාර්තා විය - (1992 LRC (Comm) @ 636) අමරසේකර එදිරිව මිට්සුයි සහ සමාගම සහ තවත් අය – *(Ameresekere v Mitsui & Co. Ltd. and Others)*. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධව විවේචනාත්මක ලෙස ප්‍රකාශ කළේ *'අතුරු තහනම් නියෝග පැන වීමට හේතු වූයේ, අධි පරිමාණයකින් HDL සමාගමෙන් හා රටින් විදේශ විනිමය සොරා ගෙන යෑම වැලැක්වීමටත්, එසේ සොරාගැනීමට තැත් කරන මුදල් වලට ශ්‍රී ලංකා රජය ඇපකරුවෙක් සේ බැඳී සිටීම හේතුවෙන්, රජයට නිශ්ශබ්දව සිටිය නොහැකිය'* යන්නද, ප්‍රකාශ කරමිනි. තවද *'අමරසේකර මෙහි බැලූ බැල්මට ඉතා ශක්තිමත් සාක්ෂි ඇති වංචාවක් තහවුරුකර ඇති බවත් සහ ඔහු සතු එම සාක්ෂි අනුව ඔහුට පහසුවෙන් සාර්ථකව ඔප්පු කිරීමට හැකි නඩුවක් ඇති බවත්'* සඳහන් කරමිනි.

**බිඳිලිය නොහැකි සාපරාධිත්වය**




- පසුව 1995 වර්ෂයේදී ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් හිල්ටන් වංචාව සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති කොමිසමක් පත් කළ අතර, එයට සොලිසිටර් ජෙනරාල්ගේ මෙන්ම අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සහයෝගයද ලැබින. සාක්ෂිකරුවන් 24 දෙනෙකුගේ සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසු, හා වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් 03 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, ඉහල පෙළේ පුද්ගලයක් කිහිප දෙනෙකුට හේතු දක්වමින් චෝදනා පත්‍ර යවන ලදි. මොවුන් අතර එවකට HDL සමාගම් අධ්‍යක්ෂවරයෙකු හා පසු කලෙක ඩී. බී. විජේතුංග රජයේ ව්‍යවස්ථා කටයුතු අමාත්‍ය වූ ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි ද විය, අදාල වකවානුවේ ඔහු ජනාධිපති ආර්. ප්‍රේමදාස ගේ ප්‍රධාන නිතිඥයෙකු හා උපදේශකයෙකු ද විය.

- මීට ප්‍රථම 1991 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්ක උසාවිය ජපානයේ සී/ස මිට්සුයි සහ සමාගමට හා ටයිසෙයි කෝපරේෂන් වෙත HDL සමාගම හා/හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විසින් (රාජ්‍ය ඇපකරු වශයෙන්) මුදල් ගෙවීම තහනම් කරමින්, අතුරු තහනම් නියෝග පනවමින් කියා සිටියේ -*'මෙම පුද්ගලයන් සමාජයෙන් ලබාගත් බලපෑම් උපයෝගි කරගැනිමෙන්, විමර්ශන වළක්වමින් දැන් උත්සාහ කරනුයේ මුදල් කෙසේ හෝ ගෙවීම ක්‍රියාත්මක කිරීමට හා සමාජයේදී ප්‍රශ්න පැන නැගීම වලක්වා ලීමටය ......... මෙම තත්වය නිර්වද්‍ය ලෙෂ පැහැදිලි කෙරේ නම්, එය වංක සංග්‍රාහික වංචාවකි.'*


- ඉන් පසුව එවකට අධිකරණ ඇමතිව සිටි ජී.එල්. පීරිස් විසින්, ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වෙත කළ ඉල්ලීම මත, ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි මෙම චෝදනා වලින් නිදහස් කිරීම සඳහා, විශේෂ ජනාධිපති කොමිෂමේ කාලය ඇය විසින් දීර්ඝ නොකරන ලද්දේ එහි පරීක්ෂණ වල අවසාන් අදියරයේය. මේ හේතුවෙන් පරීක්ෂණ

කටයුතු නතර කරන ලදී. මෙය සිදුවූයේ 2000 වර්ෂයේදී ශ්‍රී ලංකා නව ව්‍යවස්ථාවේ කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීම සඳහා, එවකට එක්සත් ජාතික පක්ෂ සාමාජික, කේ. එන්. චොක්සි හරහා විපක්ෂයේ සහාය ලබා දීමට හැකි බව ජී. එල්. පීරිස් විසින් ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගට සනාථ කිරීමෙන් පසු බව එතුමිය පසුව අනාවරණය කර ඇත. ඒසේ වූවද, එම 2000 වර්ෂයේ ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට නොහැකි විය.

- පසුව, ඉහත කී කාරණා මත එම ජනාධිපති කොමිෂම නවතා දැමීමට සිදුවීම ගැන කණගාටුව පලකරමින්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් සාපරාධි ක්‍රියාදාමය වහාම ආරම්භ කරන ලෙසට, 2004 වසරේදී ශ්‍රී ලංකා පොලිසියේ පොලිස්පති වෙත නියෝග නිකුත් කෙරිණි. කෙසේ වූවද, එම ක්‍රියාව ශ්‍රී ලංකා නීතිපති සී. ආර්. ද සිල්වා ගේ මැදිහත් වීම් හේතුවෙන් නවතා දමන ලදී. මෙයට මූලික හේතුව වී ඇත්තේ සාමාජීය -දේශපාලන මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික බලපෑම් මත බව ආරංචි මාර්ග පවසා ඇත. මෙසේ සිදු කරන ලද්දේ ජනාධිපති කොමිෂම වෙත ලැබී තිබුනු අභියෝගයකට ලක් නොවුන සාපාරාධි ක්‍රියාවල සාක්ෂි ද පසෙක හෙලමිනි.

- මින් පසුබට නොවූ අමරසේකර, මෙම වංචාව සම්බන්ධව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට පැමිණිලි කලද, ඒ පිළිබඳව එම කොමිෂන් සභාව සොයා නොබලන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා නීතිපති තිලක් මාරපන විසින් එම සභාවේ සාමාජිකයින් තමන්ගේ ව්‍යවස්ථාපිත යුතුකම් හා වගකීම් පැහැර හැර ඇති බව නිශ්චය කළේය. - ***කොළඹ හිල්ටන් හෝටලය ගොඩනැංවීම -ශ්‍රී ලංකා රජයට කළ වංචාව -වෙළුම 02 -අපරාධය හෙළිවෙයි, නමුත් අශෝභන ලෙස වසා දමයි.***

## වංචාවක් සමථයකට පත් කිරීම




- එවකට ශ්‍රී ලංකාවට වැඩිම විදේශීය ආධාර ලබා දුන් ජපාන් රජය විසින් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික බලපෑම් සහ පීඩනයන් හමුවේදී, ශ්‍රී ලංකා රජය කළ පීඩන සහ පෙළඹවීම් මත, අමරසේකර වර්ෂ 1995 / 1996 දී ඉහත ගිවිසුම් බේරුම් කිරීමට එකඟ විය. මෙම ගිවිසුම් බේරුම් කිරීම සකස් කරන ලද්දේ, හිටපු නීතිපති වරයෙකු වූ තිලක් මාරපන වන අතර, එය පසුව නීතිපතිවරුන් වූ ශිබ්ලි අසීස් හා සරත් එන්. සිල්වා විසින් අනුමත කරන ලද අතර, එයට විශේෂ ජනාධිපති කොමිසමේ සහ අමාත්‍ය මණ්ඩලයේද අනුමැතිය ලැබුනි.

- මේ අනුව, අමරසේකර එකඟ වූයේ මිට්සුයි සහ සමාගම හා ටයිසෙයි කොපරේෂන් ආයතනය ඔවුන්ගේ 1995.6.30 දින තෙක් වංචනික ඉල්ලීම් වලින් 62% කින් කපා හැරීමට වූ පොරොන්දුවට වන අතර, මෙම කපා හැරීම 1995.6.30 දීනදි යෙන් මිලියන 17,586 නොහොත් ඇමරිකන් ඩොලර් මිලියන 207 වූ අතර, ඉතිරි 38% වසර 16 ක් තුළ කොටස් වශයෙන් ගෙවීමටද, එය අඩු පොලියකට සිදු කිරීමටද ඔවුන් එකඟ විමෙන්ය.


- එම කපාහැරීම ශ්‍රී ලංකා මහා බැංකුවේ තැන්පත් පොළිය අනුව 2016.6.30 දිනට වටිනාකම රුපියල් බිලියන 89 වූ අතර, එසේ කපා නොහැරිය ශේෂය 2016.6.30 දිනට වටිනාකම වූයේ රුපියල් බිලියන 51.3 කි. අමරසේකර විසින් ගත් මෙම උත්සාහය රජයට හිමි වූ මහගු ප්‍රතිලාභයක් ලෙස, ශ්‍රී ලංකා රජය ලිඛිතව පිළිගෙන ඇත.

- එසේ වුවද, එවකට අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු වූ සී.වී. විග්නේෂ්වරන් විසින් බේරුම් කිරීමේ ගිවිසුම් වලට එරෙහිව පැවරූ නඩුවක් විභාග කිරීමේ දී, සැක සහිතව ප්‍රශ්නකාරී ලෙස දෙනු ලබන අතුරු නියෝගයක් හේතුකොට ගෙන, ශ්‍රී ලංකා රජයට හා HDL සමාගමට එම බේරුම් කිරීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හෝ ඉදිරියට ගෙන යෑම නොහැකි වූවා පමණක් නොව, HDL සමාගමට සිදු කිරීමට තිබූ මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය නැවත සකස් කිරීමට සකස් කළ යෝජනාද නැවත අත්හිටුවීමට සිදුවිය. ඉහත නඩුකරය 2014 මැයි මස නිෂ්ප්‍රභා කිරීමෙන් අනතුරුව, නැවත බේරුම් කිරීමේ ගිවිසුම් බලාත්මක විය. ඒ අතර විග්නේෂ්වරන්ගේ එම අතුරු නියෝගය හේතුවෙන් මිට්සුයි සමාගමට හා ටයිසෙයි සංස්ථාවට, අමරසේකර ඉහත කී ලෙස අඩු කල ඉතිරිය බේරුම් කිරීමේ ගිවිසුම් අනුව ගෙවීමට සිදු විය.

- 1998 වර්ෂයේදී විනිසුරු සී.වී. විග්නේෂ්වරන් ලබා දුන් දුෂ්ඨ සහගත අතුරු නියෝග වලට එරෙහිව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විසින් වහාම අවශ්‍ය ඇපැල් කිරීමේ අවසරය ලබා දුනි. විනිශ්චයකාර විග්නේෂ්වරන්ගේ අතුරු නියෝගය ලබා දීමට හේතුවුයේ අධිකරණ අමාත්‍ය මෙන්ම, මුදල් නියෝජ්‍ය අමාත්‍ය ජී.එල්. පීරිස් සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු සාමාජිකයෙකු වශයෙන් බේරුම් ගිවිසුම්වල ඔහුට පෞද්ගලිකව අහිතකරවන කොන්දේසි තිබ්මෙන්, අනිසි බලපෑම් කළ පුද්ගලයෙක් වීමය. මේ අනුව, මොවුන් දෙදෙනාම HDL සමාගම වැටි තිබුන මූල්‍යමය අවපාතයට වගකිව යුතු සහ වගවිය යුත්තන් වේ.


- අමරසේකර ක්ෂණිකව ක්‍රියාත්මක වී, අධිකරණ අමාත්‍ය හා මුදල් නියෝජ්‍ය අමාත්‍ය ජී. එල්. පීරිස්ට විරුද්ධව නීතිමය කටයුතු ආරම්භ කළ අතර, එහිදී අමරසේකර නැගූ විචාරණ වලට පිළිතුරු සැපයීමට හෝ අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමට ජී. එල්. පීරිස් ආමාත්‍යවරයාට නොහැකි විය. 2011 වර්ෂයේදී HDL සමාගම වැටී තිබුන මූල්‍ය අවපාතයට පිළියමක් ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂගේ රජය කිසිම හෝ ප්‍රතිපත්තියකට පටහැනිව, පවරා ගැනීමේ නීතියට සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන ආඥා පනතකට අනුව, HDL සමාගම රජයට පවරා ගනු ලැබුවේය. මෙම සිදුවීම වූයේ, අමරසේකර විසින් ශ්‍රී ලංකාවේ සමාගම් නීතියට අනුකූලව ශ්‍රී ලංකා වානිජ මහාධිකරණයේ නඩුවක් පැවරීමෙන්, HDL ආයතනය මූල්‍යමය ප්‍රතිසංස්කරණයට ලක් කළ යුතු යැයි නැවතත් සැළකර සිටි අවස්ථාවක වීමත්, මෙය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක චමල් රාජපක්ෂ වෙත දන්වීමක් කොට සිටි අවස්ථාවක වීමත්, මෙහිදී එළිදරව් කළ යුතුය. - ***කොළඹ හිල්ටන් හෝටලය ගොඩනැංවීම -ශ්‍රී ලංකා රජයට කළ වංචාව -වෙළුම 03 -වංචාවක් බේරුම් කිරීම***

### ණය ආපසු අයකරවා ගැනිම සහ බැංකු බලතල ක්‍රියාත්මක කිරිම




- 2003 වර්ෂයේදී අමරසේකර මහජන යහපත සඳහා පෞද්ගලිකවම ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටිමින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නීති ගත කරවාගැනීමට බලාපොරොත්තු වු සංශෝධිත ආඥා පණත් දෙකක් අභියෝගයට ලක් කරමින්, ඉතා සියුම් කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කලේය. මෙම ආඥා පනත් දෙකම බැංකුවල ණය අයකරවාගැනීම හා ඒ සඳහා බැංකු වල බලතල වැඩි කිරීම සඳහා වූ පනත්ය. අමරසේකර විසින් සිදු කළ ඉදිරිපත් කිරීම් වලින් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණ මෙම සංශෝධන ආඥා පණත් දෙකම අහෝසි කළ අතර, 1990 දී නීති ගත කළ ආඥා පණත් *'දරුණු, පීඩාකාරි, අයුතු සහගත මෙන්ම නීතියේ සරණ පැතීමට ඉඩ නොදීමක් යැයි ද සඳහන් කලේය. එහිදි සඳහන් කළ විශේෂ කරුණක් නම් 'නීතිය, බලවතුන් ශක්තිමත් නොකරමින්, අසරණයන් තවත් දුර්වල කිරීමෙන් ද, වැළකිය සිටිය යුතු බවය'.* ශ්‍රී ලංකාවේ නීති සම්පාදිත විමෙන් පසු, එයට විරුද්ධව ක්‍රියා අභියෝග ඉදිරිපත් කිරීමට ප්‍රතිපාදන නොමැත.

### ද්වේශගත 'බදු සමාව'




- එමෙන්ම 2003 වර්ෂයේදී මහජන උන්නතිය මුල්කර ගෙන, අමරසේකර එවකට පැවති අගමැති රනිල් වික්‍රමසිංහගේ රජයේන් ඉදිරිපත් කළ සියලු දේ කඩ කරමින් 'පොදු සමාව' නොහොත් 'බදු සමාවට' එරෙහිව උද්ඝෝෂණයක් දියත් කලේය. ඉහත සඳහන් HDL සමාගම වෙත ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි කල වංචාව නොසලකා හරිමින්, රනිල් වික්‍රමසිංහගේ රජයේ මුදල් ඇමති පදවිය ඔහුට පිරිනැමුනු අතර, ඔහු විසින් එම බදු සමා ' ආඥා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුණි. කේ. එන්. චොක්සි ඉහතකි හිල්ටන් වංචාවත් එය වසන් කිරීමේ භූමිකාවේ අයෙකු විය. - ***විනිවිදභාවය හා රාජ්‍ය වගවීමේ හිඟය වගවීමේ හිඟය විෂය අධ්‍යයනය - ශ්‍රී ලංකා, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන බැංකුවට විෂය පාත්‍රව***

- අමරසේකර මෙම අදමා්‍ය පොදු සමාවට එරෙහිව, එය ශ්‍රී ලංකා ව්‍යවස්ථාවට පටහැනි බව සඳහන් කරමින්, 2004 වර්ෂයේදී ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් ශ්‍රී ලංකවේ ව්‍යවස්ථාවේ 129 වැනි ව්‍යවස්ථාව අනුව එම පනත පරික්ෂා කිරිමට ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුවක් ඉදිරිපත් කරිමට කටයුතු කළේය. ඉන් අනතුරුව පස් පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ලක් ඉදිරියේ විමසීමේදී, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටිමින්, ඉතා විවේචනාත්මකව කැපී පෙනෙන තර්කානුකූල කරුණු ඉදිරිපත් කළ

අතර, එම තර්ක පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය, කේ. එන්. චොක්සි සම්මත කිරීමට තැත් කළ නීති කාණ්ඩය *'සාධාරණ නීතියට විරුද්ධවාදී බවත්, එය ජාත්‍යන්තර මිනිස් අයිතිවාසිකම් ප්‍රඥප්තියට හා ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය උල්ලංඝනය කිරීමක්' බවත් සඳහන් කරමින්, මෙය රජයට විශාල ලෙස අලාභ සිදු කරමින් මහජන ආදායම් වංචා කිරීමක් ලෙස'* නිගමනය කළ අතර; ප්‍රකාශයට පත් වූ වාර්තා අනුව, මෙම ක්‍රියාදාමය මගින් එවකට රජයට සිදුවීමට ගිය රුපියල් මිලියන 200,000 ක පමණ පාඩුවක් වළක්වා ගැනීමට හැකි විය.


- ඉහත සඳහන් කරුණු අගමැති රනිල් වික්‍රමසිංහගේ රජය කඩාවැටීමට මුල් වූ ප්‍රධාන සාධකයක් මෙන්ම, 2004 වර්ෂයේදී, ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යටතේ අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ නව රජය පිහිටුවීමට ද හේතු සාධක විය. නව රජය පිහිටුවීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සම්මත කරගත් පලමු වැනි පනත වූයේ, පෙර සඳහන් අනීතික බදු පනතය. මෙම නව නීති සකස් කිරීමේදී අමරසේකරගේ සහයද ලැබුනු අතර, නව පනත ආදායම් බදු සහනයට පමණක් සීමා විය. - ***විනිවිදභාවය හා රාජ්‍ය වගවීමේ හිඟය වගවීමේ හිඟය විෂය අධ්‍යයනය - ශ්‍රී ලංකා, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන බැංකුවට විෂය පාත්‍රව***

## රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

- ඉහත කී ක්‍රියාපටිපාටිය මත 2004 වර්ෂයේදී, ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස අමරසේකරව පත් කරන ලදි. එහිදී, අමරසේකර විසින්, මෙයට පෙර සිදු කරන ලද නොසුදුසු පෞද්ගලීකරණ ගණනාවක් හෙළිදරව් කල අතර, එම පෞද්ගලීකරණයන් විමර්ශනයට ලක්විය. පාර්ලිමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ පාර්ලිමේන්තු කමිටුව අමරසේකරගේ සහය ඇතිව, මෙම නොසුදුසු පෞද්ගලීකරණයන් 02 ක් ගැන දීර්ඝ ලෙස විමර්ශනය කොට, අනතුරුව 2007 වර්ෂයේදී එය පාර්ලිමේන්තුවට වාර්තා කරමින් කියා සිටියේ එම ක්‍රියාවන් නීති විරෝධි, අයුතු සහ වංචාකාරි බවය.


- ඉහත සඳහන් කරුණු තවදුරටත් ඉදිරියට ගෙන යමින්, අමරසේකර 2007 වර්ෂයේදී මහජන උන්නතිය උදෙසා එම පෞද්ගලීකරණ දෙක සම්බන්ධව නඩුකර දෙකක් ගොනු කලේය. විධිමාත්‍රය හේතුවෙන් මෙම නඩුකර වෙනත් පුද්ගලයෙකුගේ නමින් පැවරීමට ඔහුට සිදු වූ අතර, මෙහිදී එක් වග උත්තරකරුවෙක් වූයේ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති අමරසේකරය. ඔහු පෞද්ගලිකව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටිමින්, වාචික හා ලිඛිත දේශන ඉදිරිපත් කර ඇති අතර, මේ හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය එම පෞද්ගලීකරණය වැරදි, නීති විරෝධි හා වංචනික බව තීන්දු කලේය.

## ඉන්ධන සැපයුම් ඒකාධිකාරය පෞද්ගලිකරණය - ශුන්‍යකරණය




- ශ්‍රී ලංකා රජයේ කොළඹ වරායේ ඒකාධිකාරයක්ව පැවති, නෞකාවලට ඉන්ධන සැපයීමේ පහසුකම් සැක සහිතව ජොන් කීල්ස් නමැති මහා පරිමාණ සමාගමට පැවරීමය. එය රජයේ වත්කමේ සත්‍ය අගය රුපියල් මිලියන 15,000 ක්ව තිබියදී රුපියල් මිලියන 1,200ට විකිණීමය. එයට වඩා බරපතල වනුයේ, වරායේ නීති වලට අනුව, වරාය සතු ඉඩම් කිසිසේත්ම අන්සතු කිරීමට නොහැකි වීමය. - ***IMF ලෝක බැංකුව හා ADB පුදගලීකරණයේ න්‍යාය පත්‍රය-වෙළුම 03 කොළම වරාය බන්ධන සැපයීම පුද්ගලීකරණය - නීත්‍යානුකූල නොවන සේ සළකා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අවලංගු කිරීම***

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලිකරණය - ශුන්‍යකරණය




- ශ්‍රී ලංකා රජයට අයත් ඒකාධිකාරයක් වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මෙන්ම, ඊට අයත් ව තිබූ ලංකා හොස්පිටල්ස් පීඑල්සී (එවකට ඇපලෝ හොස්පිටල්ස් පීඑල්සී) පෞද්ගලීකරණය මුවාවෙන්, ශ්‍රී ලංකා ඉස්කාගාර සමාගම, එයිට්කන්ස්පෙන්ස් සමාගම ද ඇතුලු සමූහයකට රුපියල් මිලියන 6,050 ට විකුණා දමුනු අතර, ඉන් රුපියල් මිලියන 2,100 ක් ආපසු එම සමාගම් සමූහයට රජයෙන් ලබා ගැනීමට එන්තර වාසියක් එවීමය. මෙම සමාගම් සමූහයට සැක සහිත සමාගමක් වූ ජිබ්රෝල්ටා හි පිහිටි ''හොල්මන් සමාගමක'' (නාමමාතික සමාගමක්) ද ඇතුලත් වී තිබුණි. මෙම

ගණුදෙනුව ගැනද අමරසේකර විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට වාචික හා ලිඛිත දේශන තර්කානුකූලව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණය මෙම ගනුදෙනුව නීත්‍යානුකූල නොවන බවත්, වංචනික බවත් පිළිගනිමින් මෙම ගනුදෙනුව අවලංගු කොට රක්ෂණ සංස්ථාව නැවත රජයට පැවරුවේය. ඉහත කී රජයේ  වත්කමේ වටිනාකම රුපියල් මිලියන 26,000 ක් වශයෙන් ගණනය කර අමරසේකර සකසා තිබූ පදනම ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තේය. ***ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව පුද්ගලීකරණයේ න්‍යාය පත්‍රය  -වෙළුම 04 -ශ්‍රී ලංකා රක්ෂණ පුද්ගලීකරණ නීතිවිරෝධී හා අනීතික සේ සළකා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කිරීම***


- ශ්‍රී ලංකාවේ නීතිපති, ජනාධිපති නිතිඥ සී.ආර්. ද සිල්වා මෙන්ම මහා භාණ්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දර ද, සැක පහළ කරන අන්දමට මෙම මහජන උන්නතිය සඳහා වු නඩු කර දෙකට විරුද්ධ විය. මොවුන් මෙසේ විරුද්ධ වූවද, මෙම නඩුකර දෙකෙන් රජයට සිදුවීමට තිබූ විශාල අලාභයක් වලක්වාලීමට හැකිවිය. ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මෙන්ම, අල්ලස් සහ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මෙම කරුණු 02 සම්බන්ධව විමර්ෂණ ආරම්භ කලද, එම විමර්ශන අතර මග නතර කරන ලද්දේ, සමාජයීය සහ දේශපාලනික හේතූන් සහ, විවිධ බලපෑම් හා පීඩන හේතු කොටගෙනය. සැලකිය යුතු පුදුම සහගත ප්‍රශ්නකාරී කරුණ නම්, මෙම ක්‍රියාවට සම්බන්ධ ජාවාරම්කරුවන්, සාපරාධී නීතියේ රාමුවට හසුකර නොගැනීමය.

- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම පෞද්ගලීකරණය වෘත්තීමය වශයෙන් සකස් කෙරුනේ, සුප්‍රසිද්ධ ගණකාධිකරණ ආයතන 02 ක් වු ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් හා අර්නස් ඇන්ඩ් යන්ග් විසිනි. මෙහිදි ඔවුන් විසින් කළ ක්‍රියාවන් හා ක්‍රියා කලාපය ගැන ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි විවේචනයකට හා අවමානයට ලක්විය. එමෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම සී/ස රක්ෂණ සංස්ථාවේ විගණක තනතුරු වලින් ඉවත් කරන ලදී. මේ අතර තුර ශ්‍රී ලංකා ගණකාධිකාරි ආයතනයේ ආචාර ධර්ම කමිටුව විසින් සිදු කෙරෙමින් තිබු විමර්ශන කටයුතුද සැක පහල කෙරෙන ආකාරයට නවතා දමුනු අතර, එය එසේම සිදු වූයේ සමාජයීය සහ දේශපාලනික බලපෑම් හා පීඩනය මත බව පැහැදිලි විය.

## අපනයන වන ආදායම් නැවත මෙරටට ගෙන්වා ගැනිම


- රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂමේ සභාපති වශයෙන්, අමරසේකර විසින් එවකට විනිමය පාලක මගින් 2004 වර්ෂයේ 4 වන කාර්තුව තුල ලැබුන, 3 වන කාර්තුව තුල සිදුකරනු ලැබු අපනයන වලට විදේශ විනිමය නැවත ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රමාණය දැනගැනීමට, ස්වේච්ඡා සමික්ෂණයක් සිදු කරවන ලදී. එම සමීක්ෂණයෙන් එළිදරව් වූයේ, අපනයනයන්ගෙන් 81% ක් විදේශ විනිමය ශ්‍රී ලංකාවට ලැබෙන බවත්, සහ 19% ක් විදේශයන්හි රඳවා ගෙන ඇති බවත්ය. මෙම විදේශ විනිමය හිඟය පියවා ගන්නා ලද්දේ විදේශයන්හි රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් විසින්, ශ්‍රී ලංකාවට එවන මුදල් මගින් බව තහවුරු වේ.

## දේශිය ආදායම් දෙපාර්තමේන්තුව අක්‍රියවිම





- එම තත්වය මත, අමරසේකර ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණය වෙතින් මැන්ඩමස් රිට් අඥා පනතක් පතමින්, දේශීය ආදායම් ජනරාල්වරයා විසින් ආදායම් පනත යටතේ ඇති විධි විධාන අනුව, අවිශ්වාසික සිදුවීම්, අල්ලස් හා දුෂණ වංචා හා රේගු සහ විනිමය වංචා වලට අදාල නීති ක්‍රියාත්මක කරන බලධාරින්ට දැන්විය යුතු යයි ඉල්ලීමෙනි. නීතිපති කේ. සී. කමලසබේසන් මුලදි එකගතාව මත එවැනි මැන්ඩමස් රිට් අඥා නිකුත් කිරිමට එකගවි සමත මෝසමක් සකස් කලේය. එනමුත්, ඉන්පසුව නිලයට පත් වු නීතිපතිවරුන් වන ජනාධිපති නීතිඥ සී. ආර්. ද සිල්වා, ජනාධිපති නීතිඥ මොහාන් පිරිස් සහ ජනාධිපති නීතිඥ ඊවා වනසුන්දර මේ වැදගත් කාරණා පිළිබද උනන්දුවක් දක්වීමට මැලි  වූ බැවින්, අමරසේකර මෙම මැන්ඩමස් රිට් අඥා පනත ඉල්ලීමේ නඩුව, අවුරුදු ගණනකට පසුව ස්ව කැමැත්තෙන් ඉල්ලා අස්කර ගත්තේය - ***විනිවිදභාවය හා රාජ්‍ය වගවීමේ හිඟය වගවීමේ හිඟය විෂය අධ්‍යයනය - ශ්‍රී ලංකා, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන බැංකුවට විෂය පාත්‍රව***

### ඉන්දියන් තෙල් සමාගමේ රාජ්‍යදූත උත්සහයන් අසාර්ථක වීම





➢ තවද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂමේ සභාපති ලෙස අමරසේකර එවකට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස්වරිය වූ නිරුපමා රාඕගේ මැදිහත්වීම හෙළාදක්වමින්, ඛනිජතෙල් බෙදා හැරීමේ ඉමහත් වටිනා කොටසක් අයත් කර ගෙන තිබූ, ඉන්දියානු තෙල් සමාගම විසින් ශ්‍රී ලංකා රජයෙන් සහනාධාර සඳහා රුපියල් මිලියන 9,000 ක පමණ හිමිකම බිඳ දමන ලදී. අමරසේකරගේ එම ස්ථාවරය නිතිපති, ජනාධිපති නීතිඥ කේ. සී. කමලසබේසන් විසින් තහවුරු කීරීමෙන්, ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 5,000 ක පමණ සිදුවන්නට ගිය පාඩුවක් වැලක් වුයේ, අනාගතයේදී කිසිදු සහනාධාර නොදීමේ පදනම මතය. ***IMF, ලෝක බැංකුව, හා ADB න්‍යාය පත්‍රය පුද්ගලීකරණය-වෙළුම 02 සැකසහිත ගණුදෙනු - සිදුවිය හැකි දෙකක් ද !***

### විසර්ජන පනත් කෙටුම්පත අභියෝග කිරීම




➢ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලිකව පෙනී සිටි අමරසේකර, විශ්ලේෂණාත්මක කරුණු ඉදිරිපත් කරමින්, 2008 විසර්ජන කෙටුම්පත සාර්ථකව අභියෝගයට ලක් කලේය. මෙම කෙටුම්පත භාණ්ඩාගාර ලේකම් P.B. ජයසුන්දර, ශ්‍රී ලංකා ජනාධිපති මෙන්ම මුදල් ඇමති වූ මහින්ද රාජපක්ෂගේ අනුදැනුම මත, සකස් කර තිබුනි. මෙහිදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ විසින් මහා භාණ්ඩාගාරය තදබල විවේචනයට ලක් කල අතර, එම ආයතනයේ මූල්‍ය අවපාලනය මහජන විශ්වාසය, පාරදෘෂ්‍යභාවය හා වගකීමෙන් කටයුතු කිරීම සම්පූර්ණයෙන් පැහැර හැර ඇති බවත් පැවසීය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, රටේ ව්‍යවස්ථාවට අනුකූලව ණය ගැනීම්, ණය සේවා කිරීම හා වියදම් පිළිබඳ සවිස්තර හෙළිදරව්වක් එම විසර්ජන කෙටුම්පත් කාරක සභා අවස්ථා විවාදයේ දී ඉදිරිපත් කළ යුතු යැයි ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට දන්වීය. මේ හේතුව මත විසර්ජන කෙටුම්පත් සංශෝධන, විවාදයේ කාරක සභා අවස්ථාවේ ඉදිරිපත් කෙරින.- ***විනිවිදභාවය හා රාජ්‍ය වගවීමේ හිඟය වගවීමේ හිඟය විෂය අධ්‍යයනය - ශ්‍රී ලංකා, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන බැංකුවට විෂය පාත්‍රව***

### උද්දේශිත තෙල් හෙජින් ජාවාරම්








➢ 2009 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දී අමරසේකර විසින්, ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති නිවාර්ඩ් කබ්රාල් විසින් මුලපිරූ, භාණ්ඩාගාර ලේකම් විසින් අනුමත කෙරුණු ඉන්ධන සම්බන්ධ හෙජින් ගනුදෙනු (Oil Hedging Deals), අභියෝගයට ලක් කලේය. මෙම ගනුදෙනු හඳුන්වනු ලබන්නේ සංකීර්ණ යමකින් ඇතිවන ගනුදෙනු ලෙස වන අතර, එවන් ගනුදෙනු 'සූදු කොන්ත්‍රාත්' වශයෙන්ද ගණන් ගැනෙන අතර, නීති විරෝධී වේ. මෙම ගනුදෙනුවලට රාජ්‍ය නිලධාරීන්ද දූෂිත ලෙස සම්බන්ධ කරගෙන ඇති අතර, එක්සත් රාජධානියේ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ඇමරිකා එක්සත් ජනපදයේ සිටිබැංකුව හා ජර්මනියේ ඩොයිෂ් බැංකුවද හවුල් වී තිබුණි. මෙයට මූලික වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සාරම්භක පනතේ එවන් ගනුදෙනු සඳහා අනුමැතියක් ලබා දී නැත. ඊට අමතරව එම සංස්ථාවක් අදාළ බැංකුවල ගනුදෙනුකරුවෙකු වූ අතර, එම බැංකු ඛනිජ තෙල් සංස්ථාව පාඩු විඳින, මුදල් නොමැති ආයතනයක් බව හොඳින් දැන සිටියහ.

➢ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, සිටිබැංකුව හා ඩොයිෂ් බැංකුව නීතිමය ක්‍රියාදාමයන් සඳහා පිළිවෙලින් එක්සත් රාජධානියේ මහාධිකරණයේ ද, ලන්ඩන් හි ජාත්‍යන්තර බේරුම් කිරීමේ උසාවියේද, එක්සත් ජනපදයේ ආයෝජන මත භේද නිරාකරණය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයේද පිහිට පැතන ලදී. තවදුරටත්, මහජන අයිතීන් මත ගොනු කල නඩු මගින්, මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට මේ සැක සහිත ගනුදෙනු විසඳීමට හොඳම ස්ථානය ශ්‍රී ලංකාව බව අමරසේකර දක්වා සිටියේය. - ***ඇතිවීම/හෙඩ්ජිං ගණුදෙනුව සිටිබැංකුව හා ඩොයිෂ් බැංකුව ඛනිජ තෙල් සංස්ථාවන් - සැක සහිත හා නීති විරෝධි***

- අමරසේකරගේ මෙම මහජන උන්නතිය සඳහා වන නඩුකර 02 කම එවකට නීතිපතිව සිටි ජනාධිපති නීතිඥ මොහාන් පීරිස්ගේ දැඩි දෝෂදර්ෂණයට ලක්වූ අතර, ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය නොමග යවමින්, සාවද්‍ය ලෙස කියා සිටියේ, මෙම නඩු දෙක 'ප්‍රමාද වැඩි' බවත්, විදේශ නඩු කර වලින් ජයග්‍රහණය කිරීමට ඔහුට සහතිකවම හැකි බවත්ය. එම හේතුවෙන් මෙම නඩුකර තවදුරටත් ඉදිරියට ගෙන යෑමට අමරසේකරට ශ්‍රේෂ්ඨාධිකරණය ඉඩ නොදුන්නේය. නීතිපතිගේ මෙම ප්‍රශ්නකාරී  ක්‍රියාමාර්ග හේතුවෙන් ඛනිජ තෙල් සංස්ථාවෙන් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ඉල්ලා සිටි ඩොලර් මිලියන 160 ක මුදල පොලිය සමග අහිමි වූ අතර, ඩොයිෂ් බැංකුව ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටි ඩොලර් මිලියන 60ක මුදල  පොලිය සමග මෙම බැංකුවට ගෙවීමට සිදු විය. රජයට, රටේ මහජනතාවට මෙයින් සිදු වූ සමස්ථ අලාභය ඩොලර් මිලියන 1200 කි. ඊට අමතරව නෛතික හා අනිකුත් කටයුතු සඳහා වියදම් වූ සම්පූර්ණ මුදල රුපියල් මිලියන 220 කට ආසන්න වේ.

- පසුව සිටි බැංකුවෙන් ඉල්ලා සිටි ඩොලර් මිලියන 195 පොලිය සමග බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේය. ඔවුන්ගේ අදහස වූයේ මෙම ගනුදෙනු මුලුමනින්ම දෝෂ සහගතව සිදු වී ඇති බවය. මෙම බේරුම්කරුවන් තිදෙනා අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ මහාධිකරණයෙන් ලබා දී තිබූ නියෝගද ප්‍රතික්ෂේප කර ඇත. අමරසේකර විසින් සත්‍ය විෂයානුබද්ධ අධ්‍යයනයන් ඇතුලත් කරමින් ග්‍රන්ථ පෙලක් මුද්‍රණය කර පලකිරීමේ කටයුතු වල නිරත වි සිටි අතර, මෙම කාලය වන විට සැක කටයුතු 'හෙජින් ගනුදෙනුවෙහි' වලංගු සහ නීත්‍යානුකූලභාවය ප්‍රශ්න කරමින් පොතක් පළ කර ඇත. මෙසේ පොතක් එම අවස්ථාවේම පලකිරීම, මෙම තීන්දුව ලබා දීමට හේතු වූ බව විශ්වාස කල හැකිය.

**නිතියට අනනුකුල නොවන විසර්ජන කෙටුම්පත**





- වසර 2011 දී අමරසේකර ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලිකව පෙනී සිටිමින්, එවකට අග්‍ර විනිශ්චයකාරව සිටි ශිරානි බණ්ඩාරානායක විසින් ප්‍රකාශිත විසර්ජන කෙටුම්පතේ ශ්‍රී ලාංකීය ව්‍යවස්ථාවට අනුකූලව හදිසි කෙටුම්පතක් සේ සැලකිය යුතු යැයි ද, එවැනි කෙටුම්පතකට ප්‍රසිද්ධියේ විභාග කිරීමේ අවශ්‍යතාවයක් නොමැත යැයි තර්කයට විරුද්ධව කරුණු පැහැදිලි කිරීමට යෙදිනි. මෙම හදිසි කෙටුම්පත සඳහා විශේෂ විනිශ්චයක් කර, අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක පසුව එයින් ඇති වියහැකි සැක සහිත තත්වයද දන්වා සිටියහ. මෙහිදි ශ්‍රී ලංකාවේ නීතිපති වු ජනාධිපති නීතිඥ මොහාන් පිරිස් අධිකරණ සහායක ලෙස කටයුතු කලද, ඔහු මෙවැනි හදිසි කෙටුම්පතකින් බලපෑම් සිදුවන්නන්ගේ අවසරයකින් තොරව, ඔවුන් වෙනුවෙන් ද කරුණු දක්වා තිබුණි. මෙවැනි කෙටුම්පත් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ රජය අනවශ්‍ය කඩිනමකින් ඉදිරිපත් කළ අතර, එය එදිනම සම්මත කරගෙන පාර්ලිමේන්තු කථානායක වන චමල් රාජපක්ෂ ලවා නීතියක් ලෙස හදිසියේම සහතික කර ගෙන තිබිණි. ***- සමාජීය - දේශපාලන සත්‍ය තත්වයන් - හිල්ටන් හෝටලය බොරුව හා අවුල් සහගත නීති -පවරා ගැනීමේ නීතිය***

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව අනුව, හදිසි කෙටුම්පතක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ සැක මුසු කළ අවස්ථාවක, එවන් හදිසි කෙටුම්පතක් ව්‍යවස්ථාවට පටහැනි බව සළකා, එය පාර්ලිමේන්තුවේ හදිසි කෙටුම්පතක්/නීතියක් බවට හැරවීමෙන් වැළකී සිටිමට බැදි සිටිය.


- අමරසේකරගේ මේ සම්බන්ධව වූ උත්සාහයන් මුලදි සාර්ථක වු අතර, ඔහුගේ පෙත්සම විභාග කළ විනිසුරු මඩුල්ල අදාළ පුද්ගලයන් වග උත්තරකරුවන් ලෙස කැදවීමට නොතීසි නිකුත් කරන ලෙස ද දන්වා සිටියහ. එසේ වුවද, එම මණ්ඩලය විසින් වාචික ඉදිරිපත් කිරීම් ඇසීමෙන් සහ ගොනු කර තිබූ ලිඛිත ඉදිරිපත් කිරීම් පදනම් කරගනිමින්, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරයේ පිළිවෙත දන්වමින්, විශේෂ විනිශ්චයක් ලබාදුන් මුල් විනිසුරු මඩුල්ල මගින්ම එම විමර්ශනය කළයුතු යැයි දන්වමින් අමරසේකරගේ නඩුකරය ඉදිරියට ගෙන යෑම ප්‍රතික්ෂේප කළේය.

## අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායකට එරෙහිව දෝෂාභියෝගය





ශ්‍රී ලංකා අග්‍ර විනිශ්චයකාර ශිරානි බණ්ඩාරනායක විසින්, නව අයැඳුම ප්‍රථමයෙන් තීන්දුව දුන් විනිසුරු මඩුල්ල විසින්ම ඇසිය යුතු යැයි අමරසේකර කළ ඉල්ලීම සළකා බැලීමෙන් පසු, එම ඉල්ලීම ඉහතකී විනිසුරු මඩුල්ලෙන්ම ඇසිය යුතු යැයි තීරණය කර, එම විනිසුරු මඩුල්ලට දන්වා සිටි ඇත්තේ 'අමරසේකරගේ නඩුකරය ඇසීමට පමණක් කටයුතු කරන ලෙසත්, එහෙත් එය ඉදිරියට ගෙන යෑමට අවසර නොදෙන ලෙසත්ය.' මෙය අගවිනිසුරුවරයෙකුට නොහොබිනා ක්‍රියාවක් බවද, ඒ අනුව, වෙනත් දේ අතර, ඇය එම තනතුරට නුසුදුසු බවද පවසමින්, අමරසේකර 2012 දී ශිරානි බණ්ඩාරනායක දෝෂාභියෝගයට ලක් කිරීම යෝග්‍ය බව පවසමින්ද ක්‍රියා කලේය. එසේ කලේ විදේශීය රාජ්‍යයන්ට, ජාත්‍යන්තර නියෝජිතායතනයන්ට සහ සංගම් වලට ලිඛිතව දන්වමින්, ඔවුන්ගේ මැදිහත්වීම් පදනම් විරහිත ලෙස හෙලා දකිමිනි. ***දේශපාලනය, යුක්තිය හා නීතියේ පාලනය*** | ***පිවිසෙන්න බ්ලොග් අඩවියට*** : www.justification-for-supporting-the-impeachment-of-chief-justice.com


## ප්‍රකාශයට පත් කළ තවත් ගවේෂණ





සැක සහිත නින්දිත වංචාකාරී පෞද්ගලීකරණයන් කිරීමේදී, වතිනා තේ සහ රබර් වැවිලි ඇතුළුවද, දූෂණය, වංචාව සහ ආර්ථික අපරාධ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා රජයේ හා පෞද්ගලික අංශයේ විනිවිදභාවයකින් හා යහපාලනයකින් තොරව සහ ඊට එරෙහිව දේශපාලන බලය ඇත්තන් නීතියේ අධිපත්‍ය ක්‍රියා නොකිරීම සම්බන්ධව මහජන සුභ සිද්ධිය උදෙසා ලිපි ගණනාවක් අමරසේකර විසින් පළකර ඇත - ***IMF, ලෝක බැංකුව, හා ADB න්‍යාය පත්‍රය පුද්ගලීකරණය - වෙළුම 01 - / IMF, ලෝක බැංකුව, හා ADB න්‍යාය පත්‍රය පුද්ගලීකරණය-වෙළුම 02 සැකසහිත ගණුදෙනු - සිදුවිය හැකි දෙකක් ද !***




ඔහුගේම පෞද්ගලික ලිය ජෙට් යානාවකින් මැලේසියාවේ සිට ශ්‍රී ලංකාව බලා ආපසු එන අතර තුර, ශ්‍රී ලංකාවේ ඉහළ තලයේ ශ්‍රේෂ්ට ව්‍යාපාරකයෙකු අතුරුදහන් වීමෙන් ඔහුගේ ව්‍යාපාර සමූහය පිළිබඳ ඔහුගේ අන්තිම කැමති පත්‍රයක් නොතිබීමෙන් ඔහුගේ උරුමක්කරුවන් අතර ආරවුල් ඇතිවීමෙන් ඇති වූ විමර්ශන සහ නඩු අනුව අමරසේකර විසින් ගවේෂණයක් කර ඇත. අමරසේකර සංකීර්ණ සංස්ථාපිත ව්‍යුහයන් මුවාවෙන්, සත්‍ය හිමිකරුවන් වසන් කරමින්, තම රටවල මුදල්, විදේශ රටවල සැඟවීමේ හැකියාව සහිත ක්ෂේමස්ථාන වෙතට ගොස් පරීක්ෂණ පවත්වා ඇති අතර, ඒ පිළිබඳවද විශේෂිත දැනුමක් ලබා ගෙන ඇත. මේ සම්බන්ධව වාර්තාවක් ඔහු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. - ***'සත්‍ය අයිතිකරුවන් ' සඟවන විදේශීය සමාගම් ව්‍යුහයන් '- ශ්‍රී ලාංකික ව්‍යවසායකයෙකුගේ විදේශ ව්‍යාපාර අධිරාජ්‍ය?***




## වෘත්තිමය ප්‍රසිද්ධිය




අමරසේකර ශ්‍රේෂ්ඨ ගණයේ සමාගම් හා රාජ්‍ය ක්‍රියාකාරකම් ගැන විශේෂඥ දැනුමැති, සුප්‍රසිද්ධ වෘත්තීමය විශේෂඥයෙකු හා උපාය මාර්ග දක්ෂයෙකු ලෙස පිළිගත් පුද්ගලයෙකි. ඔහුගේ ජයග්‍රහණ අතර සමාගම් හා රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් විශේෂඥතාවය, රාජ්‍ය හා පුද්ගලික අංශවල කළමණාකාරිත්ව උපදේශක, පොදු දේපල කළමණාකරණය, නැවත සකස් කිරීම, පෞද්ගලීකරණය,ව්‍යාපෘති ප්‍රවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා රාජ්‍ය - පෞද්ගලික සබැඳියාව, මුදල් ඉංජිනේරු විද්‍යාව, බදු අයකිරීම, යහ පාලනය, ආර්ථික අපරාධ විමර්ශනය, ගවේෂණ ගණකාධිකරණය, වානිජ නීති සභය හා මහජන උන්නතිය සඳහා වූ නඩු පිළිබඳ විශේෂිත දැනුම ඔහු සතු විය. ඔහුගේ ජීවිතයේ කැප වූ ප්‍රධාන අංගයක් වූයේ මහජන උන්නතිය උදෙසා වංචා, දූෂණ සහ ආර්ථික අපරාධයට එරෙහිව ක්‍රියා කරන ලද්දේ මහජන දේපළ කොල්ලකෑම සහ මංකොල්ලකෑම දූශී දූප්පත්කම උග්‍ර කොට කැරලි ඇති කර වන ප්‍රධාන සාධකක් වීම නිසාය. - ***වංචාවට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය - වංචාව හා දූෂණය තුරන් කිරීම - පිළිකාවක් වැනි තර්ජන - කතාවලට සීමා කිරීම UNCAC සම්මුතිය මුලා කිරීමකි***

## ජාත්‍යන්තර අත්දැකීම්

ඔහු වෘත්තීමය සේවාවන් සඳහා මෙන්ම වංචනික ක්‍රියා, දූෂණය හා ආර්ථික අපරාධ මැඩ පැවැත්වීම හා යහපාලනය උනන්දු කිරීම පිළිබඳව ජාත්‍යන්තර සම්මේලන හා වැඩ මුළු චාරිකාවන්ට ජාත්‍යන්තර වශයෙන් සහභාගි වූ රටවල් - **එක්සත් ජනපදය** (වොෂිංටන්, නිව් යොර්ක්, ෆිලඩෙල්ෆියා, කනෙක්ටිකට්, මිචිගන්, වර්ජිනියා, ඉන්ඩියානාපොලිස්, මියාමි, නිව් ඔර්ලියන්ස්, ලොස් ඇන්ජලිස්, ලාස් වේගාස්, හවායි, ඇලස්කාව), **කැනඩාව** (වැන්කුවර්, කැම්ලූප්ස්, බැන්ෆ්, ලෙක් ලුවිස්, ජැස්පර්, ටොරොන්ටෝ, මොන්ට්රියල්, ක්විබෙක් නගරය, තවුසන් අයිලන්ඩ්ස්) **පැනමා, බහමාස්** (නාසාව්), **බ්‍රසීලය** (රියෝ ද ජැනයිරෝ ඉගුඅසු ඇල්ල - පරණ), **පේරු** (ලිමා, කුස්කෝ, මාචු පිචු), **කොස්ටා රිකා** (සැන් ජෝස්), **එක්සත් රාජධානිය** (ලන්ඩන්, කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ්, ජර්සි) **නොර්වේ** (ඔස්ලෝ), **ඩෙන්මාර්කය** (කෝපන්හේගන්), **ස්විඩනය** (ස්ටොක්හෝම්), **බෙල්ජියම** (බ්‍රසල්ස්), **නේදර්ලන්තය** (ඇම්ස්ටර්ඩෑම්, හේග්) **ස්විට්සර්ලන්තය** (සූරිච්, ජිනීවා), **ප්‍රංශය** (පැරිස්), **ඉතාලිය** (රෝමය, මිලාන්), **ජර්මනිය** (බර්ලින් ෆ්‍රැන්ක්ෆර්ට්), **චෙක් ජනරජය** (ප්‍රාග්), **ඔස්ට්‍රියාව** (වියානා), **හංගේරියාව** (බුඩාපෙස්ට්), **යුක්රේනය** (කියිව්), **රුසියාව** (ශාන්ත පීටර්ස්බර්ග්, මොස්කව්), **ග්‍රීසිය** (ඇතන්ස්) **මොරොක්කෝ** (මරකෙෂ්) කැසබ්ලංකා), **ස්පාඤ්ඤය** (මැඩ්රිඩ්, බාසිලෝනා), **මාලදිවයින** (මාලේ, බොහෝ දූපත්) **ඉන්දියාව** (නව දිල්ලිය, බොම්බේ, අහමදාබාද්, හයිද්‍රාබාද්, බැංගලෝර්, මයිසූර්, පුට්ටපාර්ති, චෙන්නායි, තිරුපති, පොන්ඩිචරි, ට්‍රිචි, තන්ජාවූර්, කුම්බකොනම්, කොයිම්බතූර්, ට්‍රිචූ, ත්‍රිවන්ද්‍රම්, මදුරෙයි, තුතිකොරින්, තිරුනෙල්විලි, තිරුචෙන්දූර්, නගර්කොයිල්, කන්යාකුමාරි), **පකිස්ථානය** (කරච්චි) **එක්සත් අරාබි එමීර් රාජ්‍යය** (ඩුබායි), **කුවේට්, ඊජිප්තුව** (කයිරෝ, ලක්ස්ඔර්), **නේපාලය** (කත්මණ්ඩු) **තායිලන්තය** (බැංකොක්) **මැලේසියාව** (ක්වාලා-ලම්පූර්, පෙනං, ඉපෝ) **සිංගප්පූරුව, චීනය** (බීජිං, ෂැංහයි, ඩේලියන්, ජිනාන්, නන්ජින්, ටියැන්ජින්, හුනාන් සැංසා, ෂැංජියාජි හොන් කොං, මැකෝව්) **ඉන්දුනීසියාව** (ජකාර්තා, බාලි) **පිලිපීනය** (මැනිලා) **ඔස්ට්‍රේලියාව** (සිඩ්නි, කැන්බරා, මෙල්බන්, පර්ත්) **නවසීලන්තය** (ඔක්ලන්ඩ්) **දකුණු කොරියාව** (සෝල්, බුසාන්) **ජපානය** (ටෝකියෝ, කියොතෝ, ඔසාකා, හිරෝෂිමා).

## ජාත්‍යන්තර කතෘවරයෙක්

2010 හා 2013 වර්ෂවල අමරසේකර වංචාවට විරුද්ධව සටන් කිරීම, දූෂණය, ආර්ථික අපරාධ හා මහජන මුදල්, යහ පාලනය, නීතියේ ආධිපත්‍ය ගැන වූ ඉහත සඳහන් විස්තරාත්මක පොත් රාශියක් ලියූ අතර, එම පොත් විචාරකයන්ගේ පැසසුමට ලක් වී ඇත. එම පොත් ගෝලීය වශයෙන් ව්‍යාප්ත කිරීම හා විකිණීම සඳහා පේන්ග්ගුවින් සමූහ සමාගමේ ආයතනයක් වූ ඇමරිකාවේ ඕතර්හවුස් ආයතනයට භාර විය. එම පොත් සියල්ල ලොව පුරා ප්‍රධාන පොත් හල්වලද, E වෙළඳුන් ගෙන්ද ලබා ගත හැක. අමරසේකර විසින් මෙම පොත් පිළිබඳව ලොව පුරා පිහිටි ස්ථාන රාශියක ඉදිරිපත් කිරීම් ගෙන හැර දැක්වීම් කර ඇත. එම පොත් ඇමරිකාවේ වොෂිටන් ඩී.සී. හී ඇමරිකන් කොන්ග්‍රස් පුස්තකාලයේද, ඇමරිකාවේ ටෙක්සාස් හි සහතික කළ වංචා විභාග කරන්නන්ගේ සංගමයේද, ඇමරිකාවේ වොෂිටන් ඩී.සී. හී රාජ්‍ය වගකීමේ ව්‍යාපෘතියේද, නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේද, වියනා ඕස්ට්‍රියාවේ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර දූෂණ විරෝධී විද්‍යා පීඨයේද, මැලේසියාවේ ක්වාලාලම්පූර් හි මැලේසියානු දූෂණ විරෝධී විද්‍යා පීඨයේද, පකිස්ථානයේ කරච්චි නුවර හැම්ඩාර්ඩ් සරසවියේද, හොන් කොන්ග් හි දූෂණයට විරුද්ධ ස්වාධීන කොමිසමේද, බෙයිජිං නගරයේ, ශැන්හැයි නගරයේ, පැනමා, කටාර් නගරයේ, මොස්කව් නගරයේ නඩු පවරන ප්‍රධාන කාර්යාල වලද, ලෝක බැංකුවේ පොත්හලේද, වොෂින්ටන් සහ සිංගප්පූරුවේ කළමණාකාරත්ව විශ්වවිද්‍යාලයේ පුස්තකාල වල ඇත.

අමරසේකර විසින් තහවුරු කරන ලද ලිපි ලේඛන, සාක්ෂි සහ දත්ත අඩංගු කොට විශාල නඩුකර මත ඔහු විසින් රචනා කොට ප්‍රකාශයට පත් කල පොත් මාලාව, විශේෂයෙන් වංචා, දූෂණ සහ ආර්ථික අපරාධ පිළිබඳ ගවේෂණ සහ නඩුකර පැවැත්වීමට අධ්‍යයන කරන අයවලුන්ට වූ අතර, එම එක් එක් ග්‍රන්ථයන් ලිහිල් බසින් සාරාංශය ගත කොට ගිහි පාඨකයන් සඳහා ඉංග්‍රීසි භෂාවෙන්ද, සිංහල සහ දෙමල භෂා වලින්ද පරිවර්තනය කොට ප්‍රකාශයට පත්කර ඇත.








## පෞද්ගලික

ඔහුගේ භාර්යාව වූ ලීලාමනි බටහිර හා ඉකබානා මල් සකස් කිරීම සඳහා මහත් උද්යෝගයක් දක්වන අතර, ඔවුන්ගේ පුත්‍රයා වූ ධනන්ජන ගෘහ නිර්මාණ ශිල්පියෙකි. ඔහු ඇමරිකාවේ යේල් විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්පය හා ආර්ථික විද්‍යාව ගැන උපාධිධාරියෙකු වන අතර, ඇමරිකන් ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වේ. අනතුරුව ඔහු ඇමරිකාවේ පෙනිසල්වීනියා සරසවියේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විවිධ සම්මාන දිනා ගනිමින් ශාස්ත්‍රපති උපාධියද ලබා ගත්තේය. ඔවුන්ගේ දුව වූ ධීෂානා ඇමරිකාවේ වොෂිටන් ඩී.සී. හි පිහිටි ඇමරිකන් සරසවියෙන් ව්‍යාපාර පාලනය සඳහා වූ උපාධිය හිමිකර ගත්තාය. එමෙන්ම ඇය හෝටල් හා ආපනශාලා මෙහෙයුම් පිළිබඳ සහයක උපාධිය ලබා ගත්තේ හවායි කැපිඕලානි විද්‍යාලයෙනි. ඉන් පසුව ඇය, චාරිකා කර්මාන්ත කළමණාකරන පිළිබඳව ඇමරිකාවේ හවායි සරසවියේ උපාධියක් ලබා ගෙන ඇත. ඔවුන්ගේ දෙවැනි පුත්‍රයා වූ ශර්වජන ඇමරිකාවේ මිචිගන් සරසවියෙන් කර්මාන්ත හා මෙහෙයුම් පිළිබඳ උපාධියක් විශිෂ්ඨ ලෙස ලබා ගත් අතර ඇමරිකාවේ දකුණු කැලිෆෝනියා සරසවියේ ඉංජිනේරු කළමණාකරනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ලබා ගෙන ඇත.

## අමරසේකර පිළිබඳ සහතික

1. බැනඩාවේ වින්ඩ්සර් විශ්වවිද්‍යාලයේ ගෞරව සහිතව සම්මානිත නීතිය පිළිබඳ මහාචාර්ය / ඉනර් ටෙම්පිල් හි බැරිස්ටර් / ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ හිටපු සභාපති ආචාර්ය ලක්ෂ්මන් මාරසිංහගේ සහතිකය

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති / මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් හා හිටපු භාණ්ඩාගාර ලේකම් / ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධනගේ සහතිකය

3. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ජනාධිපති නීතිඥ / එක්සත් රාජධානිය, ලින්කන් ඉන් හි බැරිස්ටර් කේ. කනග්-ඊශ්වරන්ගේ සහතිකය

# සහතික

<u>*පරිවර්තනයකි*</u>


දුරකථන / தொலைபேசி / Telephones :

සභාපති / தவிசாளர் / Chairman – 2872428

කොමසාරිස් / ஆணையாளர் / Commissioner – 2872428

ලේකම් / செயலாளர் / Secretary – 2872426

සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary – 2872427

කාර්යාලය / அலுவலகம் / Office – 2872421

ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

இலங்கையின் சட்ட ஆணைக்குழுத் திணைக்களம்

DEPARTMENT OF THE LAW COMMISSION OF SRI LANKA

ෆැක්ස් / பெக்ஸ் / Fax – 2872426

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

428/11, 3 වෙනි මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

428/11, 3ஆம் மாடி, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

428/11, 3rd Floor, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date


**ඔබගේ දැන ගැනීම සඳහා**

නිහාල් ශ්‍රී අමරසේකර මහතා මා බොහෝ කාලයක සිට හොඳින් හඳුනන අයෙක් වන අතර, නමුත් වඩාත් විශේෂිතව, පොදු සමා නීතිය (ආදායම් බදු සමාව මුවාවෙන්) මත, විධායක ජනාධිපතිගේ පාලනයකින් තොරව, පාර්ලිමේන්තුව විසින්, හුදෙක් ආදායම් බදු පමණක් නොව, තීරු බදු සහ රේගු උල්ලංඝනය කිරීම්, සුරා බදු සහ උල්ලංඝනය කිරීම්, විදේශ විනිමය නීති උල්ලංඝනය කිරීම් සහ දඩ මුදල් යනාදී සියලුම උල්ලංඝනය කිරීම් මගින් නීතිය උල්ලංඝනය සහ රාජ්‍ය ආදායම් වංචා කල සියලු දෙනාට පොදු සමා ආවරණය සැපයීම සඳහා නීති පනවමින් කටයුතු කිරීම මත, වර්තමාන විපක්ෂ නායක සහ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ උප සභාපති, අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය වෙත අභියෝග කිරීමට ඔහු විසින් තෝරා ගැනීමෙන් පසුවය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි බලය අතික්‍රමණය කරමින් ප්‍රකාශ කරනු ලැබූ නීතිය ඉක්මවා කටයුතු කල අවස්ථාවන්හිදී, ඒ මත ඔහු විසින් අභියෝගයට ලක් කල සමහර අංගයන් ශූන්‍ය සහ බල රහිත බවට ඔහු විසින් සාර්ථක ලෙස සඳහන් කරනු ලැබූ සහ තවද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිඥාව ප්‍රකාශ උල්ලංඝනය කිරීම් බවට සාර්ථක ලෙස සඳහන් කරනු ලැබූ අභියෝගයන්හි සමහර අංග සඳහා සහාය ලබා දෙන ලෙසට අමරසේකර මහතා විසින් මා වෙතින් ඉල්ලා සිටින ලදී.

එයින් පසුව, අමරසේකර මහතා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස, සහ පසුව ජනවාර්ගික ගැටුම සම්බන්ධයෙන් දෙමළ විමුක්ති කොටි ව්‍යාපාරය සමඟ කටයුතු කිරීමට විධි නියෝග ලැබූ ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා සාම ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ - නීති (ප්‍රධාන නීති නිලධාරී) ලෙස (එවකට එහි සභාපතිත්වය දරන ලද්දේ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් විශ්‍රාම ලත් ජයන්ත ධනපාල මහතා විසිනි.) සේවය කල සමස්ථ කාල වකවානුව පුරාවටම ඔහු සහ මා අතර සමීප වෘත්තීමය සම්බන්ධතාවයක් පවත්වා ගන්නා ලදී. එම කාලය වර්ෂ දෙකක් ඉක්ම වූ කාලයකි. ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ජනවාර්ගික ගැටුම් පැවති ප්‍රදේශයන්හි ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා බහු පාර්ශ්වික ආයෝජන ඇපකර නියෝජිතායතනයෙහි (MIGA) (ලෝක බැංකු සහායක) ඇපකරුවන් ස්ථාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා, සාම ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අමරසේකර මහතා විසින් සිදු කරන ලදී.

එම කාලය තුල, ශ්‍රී ලංකා වරායේ නැව් සඳහා තෙල් සැපයුම් බහාලුම් පහසුකම් ලබා දීම සඳහා කැඳවීමේදී, කොන්තාත්තුවක් මගින් සම්බන්ධ වෙමින් සිංගප්පූරු සමාගමක් විසින් සිදු කරනු ලැබූ අවිධිමත්, නීති විරෝධී ක්‍රියාකාරකමක් පිළිබඳව, අමරසේකර මහතා විසින් අනාවරණය කර ගන්නා ලදී. බේරුම්කරණයේදී ඔහු අදාල සමාගම සමඟ සම්බන්ධව කටයුතු කල අතර, මා එම බේරුම්කරුවන්ගෙන් එක් අයෙකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ අත්සන කූට ලෙස භාවිතා කිරීම ඇතුළුව, අමරසේකර මහතා සතුව තිබූ අනුමානයන් ගණනාවක් බේරුම්කරණයේදී හෙළි විය. අප සිංගප්පූරු සමාගමට එරෙහිව නඩු වියදම් නියම කලෙමු. පසුව එම සමාගම අතුරුදහන්ව ඇති බව අප විසින් සොයා ගන්නා ලද අතර, නඩු වියදම් අයකර ගැනීම සඳහා බේරුම්කරණ නියෝග ලබා දීමට එම සමාගම සොයා ගත නොහැකි විය.

ඉන්දියානු අධිකරණයන් මෙන් නොව, ශ්‍රී ලංකා අධිකරණයන් විසින් මහජන සුභ සිද්ධිය සඳහා වන නඩු කීමේ කටයුතු (P.I.L.) යනුවෙන් කුමක් අදහස් කරන්නේදැයි හඳුනා නොගන්නා ලදී. අමරසේකර මහතා විසින් සම්බන්ධ වූ මෑත කාලීන ආසන්නතම බැඳීමේදී, විසර්ජන පනත් කෙටුම්පතෙහි සමහර අංගයන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි බලය අතික්‍රමණය කරන බවට ශ්‍රී ලංකා නීතිපතිට එරෙහිව අභියෝග කරමින්, ඔහු විසින් ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ඒ අනුව, විසර්ජන පනත් කෙටුම්පතෙහි සමහර අංගයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ අනනුකූල බවට ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ තර්ක කරන ලදී. ඔහු විසින් එම ක්‍රියාමාර්ග ආරම්භ කිරීමෙන් අනතුරුව, එකිනෙකට වෙනස් වූ පාර්ශවයන් අටක් ඔහුගේ පෙත්සමට සහාය වනු පිණිස, ඔහු සමඟ සම්බන්ධ විය. අමරසේකර මහතාගේ

ස්වකීය විනිශ්චය කිරීමේ නීත්‍යානුකූල තත්වය, ඔහු විසින් තර්ක කල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාව මත පදනම් වූ අතර (ශ්‍රී ලංකා අධිකරණ පද්ධතිය තුල මෙයට පෙර අභ්‍යාස කරනු නොලැබූ ව්‍යවස්ථාවකි.) එමගින් මහජනතාව නියෝජනය කිරිම සඳහා අයිතිය ඔහු වෙත ලබා දීම සිදු විය.

මෙය ශ්‍රී ලංකා නීති සංග්‍රහයේ කොටසක් වශයෙන්, මහජන සුභ සිද්ධිය සඳහා වන නඩු කීමේ කටයුත්ත හඳුනා ගැනීමේ විශේෂ ලක්ෂණය තුල අභියාචනය විය. නිතීඥ සංගමයෙන් තර්ක කිරිම සඳහා අමරසේකර මහතා වෙත ආරාධනා කල බව අගවිනිසුරු විසින් කල්පනා කරන ලදී. මෙමගින් මහජන සුභ සිද්ධිය සඳහා වන නඩු කීමේ කටයුත්ත, ශ්‍රී ලංකා නීති සංග්‍රහය තුලට හඳුන්වා දීමට වටිනාකමක් පවතින ලෙසට, ශ්‍රී ලංකා අධිකරණය විසින් පිළි ගැනීම සඳහා පෙළඹවීම තුල අමරසේකර මහතා විසින් සාර්ථක බවට පත්වූ සේ හෝ අමරසේකර මහතා මහජන නියෝගයන්හි භාරකරු ලෙස සහ ජාතියේ මුරබල්ලකු ලෙස ශ්‍රී ලංකා සමාජය කෙරෙහි ඔහුගේ දායකත්වය ශ්‍රී ලංකා අධිකරණය විසින් අගය කරනු ලැබීමට පාත්‍ර වූ ලෙස හෝ අඟවනු ලබයි. නැතහොත් අමරසේකර මහතා විසින් ආඩම්බරයට පත් විය යුතු සාධකයක් ලෙස මෙම නිරූපණය සැළකිය යුතුය. 2007 ඔක්තෝබර් 11 වන දින පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කිරීමට ප්‍රථම එය සියුම් ලෙස පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ කොටස්කරුවකු වශයෙන් කටයුතු කිරීමට මා හට සිදු විය. පාර්ලිමේන්තුවේ ගරු. කථානායක වෙත ශ්‍රේෂ්ඨාධිකරණයේ නිශ්චය බලාපොරොත්තුවෙන් සිටී.

පූර්වයෙන්, අමරසේකර මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පරිපූර්ණ විනිශ්චය මඬුල්ලක් ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටිමින්, දේපල සහසන් කිරීම සහ ණය අයකර ගැනිම සම්බන්ධව හඳුන්වා දෙනු ලැබූ නීතිවලට එරෙහිවද තර්ක කරන ලදී. අමරසේකර මහතා එම කරුණු දෙකෙහිදීම සාර්ථක වූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉන්දියානු සුප්‍රකට විනිශ්චයක් උපුටා දක්වමින්, නිශ්චිතව සඳහන් කරන ලද්දේ, රළු, පීඩාකාරී සහ අයුතු නීති වෙත පහර දිය යුතු බවත්, සහ නීතිය මගින් ශක්තිය වඩා ශක්තිමත් කිරීමට සහ දුර්වලකම වඩා දුර්වල කිරීමට හෝ නොහැකි බව නිශ්චය කරන ලදී.

රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව විසින් වංචාවක් ලෙසට සළකනු ලැබූ රක්ෂණ අංශයෙහි සහ ඉන්ධන සැපයුම් අංශයෙහි ප්‍රධාන පෞද්ගලීකරණයන් දෙකක් අවලංගු කර නිශ්ප්‍රභා කිරීම සඳහා ස්ථාපිත කරනු ලැබූ මහජන සුභ සිද්ධිය සඳහා වන නඩු ක්‍රියාවන් දෙකක් තුල අමරසේකර මහතා ඉතා සමීපව සම්බන්ධ වෙමින් පෙනී සිටින බව මම ද දැනුවත් වෙමි.


ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ සභාපති වශයෙන්, කොමිෂන් සභාව මූල්‍ය සහ ආදායම් ස්වභාවයේ නීති සම්පාදනයන් සමඟ කටයුතු කිරීමේදී මා විසින් නිරන්තරයෙන් අමරසේකර මහතා වෙත උපදේශ ලබා දුනිමි. එසේම අමරසේකර මහතා, සංස්ථාපිත නීතිය තුල පිළිගත් ජාත්‍යන්තර අභ්‍යාසයන් එක පෙළට පවත්වා ගනිමින්, 2007 මැයි මස නව සමාගම් පනතක් ක්‍රියාකාරීත්වය තුලට රැගෙන පැමිණි, සමාගම් නීති උපදේශන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයකුද වේ.

මා මෙම ලිපිය මේ තරම් දීර්ඝ ලෙස සිදු කිරිමට අදහස් නොකලෙමි. දේශයේ යහ පැවැත්ම පෝෂ්‍ය කිරිම වෙනුවෙන් මා සහ අමරසේකර මහතා පෞද්ගලිකව සම්බන්ධ වූ අවස්ථාවන් සඳහන් කිරිමට පමණක් මෙම ලිපිය සීමා කලෙමි. රාජ්‍යයන් සහ බහු ජාතික සමාගම් විසින් ඔවුන්ගේ අපක්‍රියාවන් අනාවරණය කර ගැනීම වලක්වා ලීමට කටයුතු කරනු ලැබූයේ කෙසේද යන්න පිළිබඳව විචක්ෂණ දැනුමක් අමරසේකර මහතා සතුව පවතී. මෙම කරුණු සම්බන්ධයෙන් ඔහුගේ සංවේදය දිවැස් ඇත්තකුගේ උපදේශයන් වැනිය. සිංගප්පූරු සමාගමක් සමඟ ඉහතින් සඳහන් බේරුම්කරණයට සම්බන්ධ වූ මා මේ පිළිබඳව සාක්ෂි දරමි. ගණකාධිකාරීවරයකු ලෙස ඔහුගේ වෘත්තීයමය පසුබිම සහ අධිකරණ හැකියාවන් සහ නීතිය පිළිබඳ ඔහු සතු දැනුම ඔහු අද්විතීය පුද්ගලයකු බවට පත් කරයි.

අමරසේකර මහතාගේ ඒකාග්‍රතාවය අවලාදය ඉක්මවා යන්නකි. ඉහළ සදාචාරාත්මක පුද්ගලයකු සහ ඉහළ මූලධර්ම රකින්නකු ලෙස ඔහුගේ චරිතය ප්‍රශ්න කිරීම් ඉක්මවා යන්නකි. ඔහුගේ මෙවැනි ගුණාංගයන් මගින්, රටක උත්තරීතරම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණ වැනි කොටස්හි ගෞරවය පවා ඔහු වෙත උපයා ගෙන ඇත. මෙම රට තුල වංචාවන් සමඟ සම්මිශ්‍රණය වී ඇති දූෂණයන්ට එරෙහිව මුරකරන්නකු ලෙස පිළිගැනීමක් ඔහු විසින් උපයා ගෙන ඇත්තේ, ඔහු සතු මෙම ගුණාංගයන් තුලිනි.


ආචාර්ය ලක්ෂ්මන් මාරසිංහ
ගෞරව සහිතව විශ්‍රාමලත් නීතිය පිළිබඳ මහාචාර්ය
වින්ඩ්සර් විශ්වවිද්‍යාලය
වින්ඩ්සර්, කැනඩාව

ඉනර් ටෙම්පල්හි
බැරිස්ටර් (එංගලන්තය)
නීතිඥ (ශ්‍රී ලංකා)
සභාපති, ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව

2007 නොවැම්බර් 02 වන දින

*<u>පරිවර්තනයකි</u>*

**අමරානන්ද සෝමසිරි ජයවර්ධන**
**ලලිතා ජයවර්ධන**

**Amarananda Somasiri Jayawardena**
**Lalitha Jayawardena**

**<u>ඔබගේ දැන ගැනීම සඳහා</u>**

## <u>නිහාල් ශ්‍රී අමරසේකර</u>

ශ්‍රී ලංකාවෙහි මහආණ්ඩුව සහ එහි පිම්බුණු නිලධාරීවාදය තුල, මහජන සුභසිද්ධිය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් සඳහා නිර්භය සහ අසමසම සටන්කරුවකු ලෙස කටයුතු කරන නිහාල් ශ්‍රී අමරසේකර මහතා සම්බන්ධයෙන් සඳහන් කිරීමට ලැබීම ප්‍රහර්ශයකි. ඔහු විසින් තනි පුද්ගලයකු ලෙස බොහොමයක් කාර්යයන් සිදු කරනු ලැබූ අතර, එම කාර්යයන් සම්බන්ධයෙන් සංක්ෂිප්තව කෙටි සටහනක් තැබීම සිදු කල නොහැක්කකි. සත්‍ය වශයෙන්ම, ඔහුගේ එකී ධර්ම සටන සම්බන්ධයෙන් ග්‍රන්ථයක් රචනා කරන ලෙස මා ඔහුට නැවත නැවතත් උපදෙස් ලබා දුනිමි. ඔහුගේ පිළිතුර වූයේ, ඔහු ඒ සඳහා කටයුතු කරමින් සිටින බවත්, ඔහු විසින් ඔහුගේ නඩු කටයුතු වල ඇලී ගැලී නිමග්න වන බැවින්, ග්‍රන්ථ රචනය සම්පූර්ණ නොවන ආකාරයක් පෙනී යන බවයි.

නිහාල් මාගේ අවධානයට යොමු වූයේ, 1980 අවසාන භාගයේ හෝ 1990 මුල් භාගයේ පමණ තරුණ කලමනාකරණ ගණකාධිකාරීවරයකු වශයෙන් වන අතර, ඔහු රජයේ දූෂණ ක්‍රියාකාරකම් අනාවරණය කිරීම ඔස්සේ මහජන කීර්තිය ලබා සිටින අවස්ථාවේදීය. රජයට අවාසිදායක කොන්දේසි ඇතුලත්ව හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ප්‍රදානය කිරීම සිහිකල යුතු අවස්ථාවකි. ඔහු විසින් වර්ෂ 1990 දී ශ්‍රී ලංකාවේ පළමු නීතියේ ව්‍යුත්පන්න ක්‍රියාව ස්ථාපනය කරන ලද අතර, ජපන් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීම් තහනම් කිරීමට එමගින් අධිකරණ බලය ලබා ගන්නා ලදී. රජයේ ආදායමට මාරාන්තික අලාභයක් සිදු කිරීම සඳහා සම්බන්ධ වෙමින්, රජය විසින්, සිනමාත්මක හේතු සඳහා රුචිකත්වය සහිත ගනුදෙනුකරුවන් වෙත නිදහස් ආනයන බදු සහන ප්‍රදානය කිරීම සම්බන්ධයෙන්ද ඔහු විසින් අවධාරිත ආලෝකය දල්වන ලදී. ඔහු තවදුරටත් රාජ්‍ය වත්කම් සහ ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමේ බරපතල අක්‍රමිකතාවයන් අනාවරණය කරන ලද අතර, ඒ සඳහා මාධ්‍ය මගින් නොයෙක් ගරුබුහුමනට පාත්‍ර විය. නිහාල් විසින් සිදු කල හෙලිදරව් කිරීම් 1994 මහ මැතිවරණයේදී ප්‍රධාන ගැටලු බවට පත් වූ අතර, එමගින් පැවති රජය බිඳ වැටීම සහ දූෂණ මත සටන් කිරීම ඇතුලත්ව මැතිවරණ වේදිකාව තැනූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ රජය බලයට පත් වීම සිදු විය.

මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අමාත්‍යවරයාද වූ නව ජනාධිපති විසින් මා හට එම අමාත්‍යාංශයේ සහ මහාභාණ්ඩාගාරයේ ලේකම් තනතුර භාර ගන්නා ලෙසට ආරාධනා කරන ලදී. එකී ස්වභාවයේදී, පූර්ව රාජ්‍ය පාලනය විසින් සිදු කරන ලදැයි චෝදනා ලැබූ දූෂණයන් විමර්ශනය කිරීම සඳහා, විශේෂ ඉහළ මට්ටමේ උපදේශකයකු ලෙස අමාත්‍යාංශයීය සේවයට එක් වන ලෙස අප ඔහුට ආරාධනා කලෙමු. විශේෂයෙන් එසේ සිදු කරන ලද්දේ, නිලධාරීන් අක්‍රමිකතා ආරක්ෂා කිරීමට වඩාත් නැඹුරුවක් දැක්වූ බැවිනි. ඔහු මහා පරිමාණයේ ලිපි ගොනු අතැතිව, දියෙන් ගොඩ ගන්නා මාලුවකු සේ දූෂණය මත අතුල් පහර ලැබූ බොහොමයක් ක්‍රියාවන් අනාවරණය කරමින් සහ ඒ සම්බන්ධයෙන් ප්‍රතිකාර ක්‍රියාවන් ආරම්භ කරන ලදී.

ප්‍රධාන හිමිකරු වූ රජය අති විශාල අලාභයක් ලැබූ බව හෙලි වූ හිල්ටන් කොන්ත්‍රාත්තුව යනු ප්‍රධාන ගැටලුවකි. නිහාල් විසින් ප්‍රමාණවත් සාක්ෂි රැස් කර ගනිමින්, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් අපහට නැවත වරක් සළකා බලා සාකච්ඡා කිරීමට හැකියාව ලබා දුනි. ඔහු විසින් සාකච්ඡා කිරීමේදී, සෘණාත්මක අන්තර් වාක්‍යය කිහිපයක්ම වෙනස් කිරීම සඳහා ඉහළ හැකියාවකින් යුතුව මා වෙත සහාය ලබා දුන් සහ ප්‍රධාන කොටස්කරු වශයෙන් රජයට සිය අයිතීන් ලබා ගැනීමටද හිමිකම උදා කර දුනි. එසේම සිංගප්පූරු සමාගමක් විසින් සිදු කරනු ලැබූ විශාල පරිමාණයේ තිරිඟු පිටි ඇඹරුම් කර්මාන්තශාලාවක් පිහිටු වීම පිළිබඳ පීඩාකාරී කොන්ත්‍රාත්තුව නැවත සාකච්ඡාවට සළකා බැලීමේදීද ඔහු මා වෙත සහාය දැක්වීය.

සියලුම පෞද්ගලීකරණයන්හිදී විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීමට පිහිටවනු ලැබූ "රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්) (PERC)" ශක්තිමත් ලෙස ස්ථාපිත කිරීමේ මූලික සැකසුම් සිදු කිරීමේදීද ඔහු මා සමඟ කටයුතු කරන ලදී. පසුව පර්ක්හි සභාපති ලෙස ඔහුට කටයුතු කිරීමට ලැබීම ඔහුගේ හැකියාවන් සහ ඒකාග්‍රතාවය සඳහා වන ප්‍රසංශාවට අනුකූලවේ.


මා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් කටයුතු කිරීම සඳහා 1995 අග භාගයේදී මුදල් අමාත්‍යාංශයෙන් ඉවත් වූ පසුවද ඔහු අමාත්‍යාංශය සමඟ අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරගෙන යන ලදී. එසේ වුවද, මා මේවන විටත් ඔහු සමඟ සමීපව සිටින අතර, විදේශ විනිමය පාලන අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී පවා ඔහු වෙත සහාය දැක්වූයෙමි.

නිහාල් 1995 අමාත්‍යාංශයෙන් ඉවත් වීමෙන් පසුව මහජන සුභ සිද්ධිය සඳහා වන ක්‍රියාකාරකම්හි අඛණ්ඩව නියැලුණි. වඩාත් සිහිකල යුතු වන්නේ, බදු පමණක් නොව රජයේ දඩ මුදල් සහ අයකිරීම් ආදිය පවා වංචා කල විවිධ ආකාරයේ දුර්ජනයින් වෙත බදු සමාව විශාල වශයෙන් පැතිරවීම ඔහු විසින් අධිකරණය තුල අභියෝගයට ලක් කිරීමයි. එකී බදු සමාව දේශීය නීතිවලට සහ ජාත්‍යන්තර අභ්‍යාසයන්ට පවා එරෙහි බවට අධිකරණය විසින් තීරණය කරන ලදී. ඒ අනුව එම ක්‍රියාමාර්ගයන් ඉවත් කර ගැනීමට සිදු විය.

වඩාත් ආසන්න ලෙස, 2007 වර්ෂයේදී, ඔහු විසින් විසර්ජන පනත් කෙටුම්පත (අයවැය නීතිය) අභියෝගයට ලක් කරනු ලැබූ අතර, ඔහු විසින් එසේ සිදු කරනු ලැබුවේ, නීතියෙන් සලස්වා ඇති පරිදි වන මූල්‍ය වගකීම් උල්ලංඝනය කිරීම සහ මහජනතාව වෙත ප්‍රමාණවත් තරම් තොරතුරු ලබා නොදීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ලැබීම සහ විශේෂ ක්‍රියාකාරකම් වල ශීර්ෂගත ප්‍රතිපාදන වෙනත් ක්‍රියාකාරකම් වලට  මාරු කිරීම සඳහා නිලධාරීන්ට අවසර ලබා දීම වෙනුවෙනි.

රජයේ වංචා සහ දූෂණ අභියෝගයට ලක් කිරිම සඳහා වූ නිහාල්ගේ මහජන සුභ සිද්ධිය සඳහා වූ ක්‍රියාවන් බොහෝ වූ අතර, ප්‍රධාන වෘත්තීයමය ගණකාධිකාරී සහ කලමනාකරණ උපදේශකයකු වශයෙන් මූල්‍යමය වාසිදායක අභ්‍යාසයන්හි අඛණ්ඩව නිරත වන අතරතුර, මෙවැනි මහජන යහපත උදෙසා වන කටයුතු සිදු කිරීම සඳහා ඔහු විසින් ශක්තිය සහ කාලය සොයා ගන්නේ කෙසේද යන්න පිළිබඳව මා පුදුමයට පත් වෙමි. අතිවිශේෂ අධිකරණ දැනුමක්, අහස උසට වන ලේඛන පරික්ෂාකාරීව සෝදිසි කර බැලීම සඳහා වූ විමර්ශනාත්මක හැකියාවක් සහ දේශයේ නීති සහ රෙගුලාසි පිළිබඳව තේරුම් ගත නොහැකි තරම් දැනුමක් ඔහු සතු වේ. ඔහු විසින් විධිමත් පරිදි නීතිය හදාරා නොමැති වුවද, ඔහුගේ නීතිමය හැකියාව ප්‍රධාන නීතිඥවරුන් විසින් විශාල ප්‍රසාදයකින් යුතුව අගය කරනු ලබයි.

නිහාල් විසින් ඔහුගේ විමර්ශනයන්හි කරුණුවල බලවත්භාවය මත නොයෙක්විට ගැටුම්කාරී තත්වයකට පැමිණ ඇති අතර; එබැවින්, සතුරන්ගෙන් සිය පෞද්ගලික ආරක්ෂාව තහවුරු කර ගන්නා ලෙස මා ඔහුට බොහෝ වර උපදෙස් ලබා දී ඇත. නිහාල් මාර්ගයෙන් ඉවත් වනු දැකීමට ප්‍රිය බොහෝ දූෂිත තැනැත්තන් සිටින බව මා හොඳින්ම විශ්වාස කරමි. ඔහු ඒ බව දන්නා බවට සිනහ සී සහ ඒ පිළිබඳ ගණන් නොගෙන ඉදිරියට යයි. රාජ්‍ය සේවය යනු සැමවිටම මහජනයාට වගවිය යුතු විශ්වාසී සේවයක් බවට සම්පූර්ණයෙන්ම වන භක්තිමත් විශ්වාසයක් ඔහුව මෙහෙයවනු ලබයි. රාජ්‍ය සේවය යනු ඔහුට ඒකාග්‍රතාවයේ පැතිගල් වේ. මෙම විශ්වාසයන් ඔහුව ඉදිරියට ගෙන යාමට සහ මෙම උත්සාහයන් සඳහා අති විශේෂ අමතර ශක්තියක් මුදා හැරීමට ඔහුට හැකියාව ලබා දෙන බව පෙනී යයි. යම් දිවැස් ඇත්තකු විසින් හෝ කර්ම බලයක් විසින් ඔහුව මෙලෙස ඉදිරියට ගෙන යන බව සහ ආරක්ෂා කරන බව ඔහු සිතන බව මා අනුමාන කරමි.



ඒ. එස්. ජයවර්ධන
ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික අධිපති
මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්
මහාභාණ්ඩාගාරයේ හිටපු ලේකම්
විද්‍යා හා තාක්ෂණික කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු ලේකම්
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු විකල්ප විධායක අධ්‍යක්ෂ
ලංකා බැංකුවේ හිටපු සභාපති සහ සාමාන්‍යාධිකාරී
1958 සිට ශ්‍රී ලංකා මහබැංකු සේවක



2007 ඔක්තෝබර් 31
89-1, සුභද්‍රාරාම පටුමග
නුගේගොඩ
ශ්‍රී ලංකාව

<u>*පරිවර්තනයකි*</u>

**K. Kanag-Isvaran,** *President's Counsel*
LL.B. (Lond), of Lincoln's Inn, Barrister
Advocate, Supreme Court of Sri Lanka

104, Isipatana Mawatha,
Colombo 5.
Sri Lanka.
T'phone: (94-11) 2584507 (Residence)
(94-11) 2591655 (Chambers)
Telefax: (94-11) 2586710

2007 ඔක්තෝබර් 20 වන දින

**ඔබගේ දැන ගැනීම සඳහා**

නිහාල් අමරසේකර මහතා මා හොඳින් හඳුනන අයෙකි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ වරලත් කලමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකි. වත්මනෙහි ඔහු ප්‍රධාන වශයෙන් ගෞරවයෙන් යුතුව, කළමනාකරණ සහ මූල්‍ය උපදේශකයකු ලෙස අභ්‍යාස කරනු ලබයි.

මා විසින් පළමුවෙන්ම ඔහුව හඳුනා ගනු ලැබුවේ වර්ෂ 1990 මැද භාගයේදී වන අතර, ශ්‍රී ලංකා රජය විසින් බහුතර කොටස් හිමිකාරීත්වය සහිතව අයිතිය දරනු ලැබූ කොළඹ හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් කටයුතු වලදී සිදුවූ අති විශාල වංචාවක් සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ නඩු කටයුත්තක් ස්ථාපිත කිරීමට අදාලව උපදේශ ලබා ගැනීමට පැමිණි අවස්ථාවේදීය.

මෙම ක්‍රියාව, වර්ෂ කිහිපයක් පුරා පැවති, ආයතනික නීති ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයීය විනිශ්වයක් සමඟ අවසානයේදී අධිකරණ ඉතිහාසයේ අවකාශයක් නිර්මාණය කිරීමට සමත් වූවකි.

මෙම කාල වකවානුව තුලදී, මා හට ඔහු සමඟ අන්‍යොන්‍ය වශයෙන් කටයුතු කිරීමට සහ එමගින් ඔහුගේ ජීවිතයේ දැක්ම සහ පරමාර්ථය අවබෝධ කර ගැනීමට අවස්ථාව ලැබුණි.

රාජ්‍ය සහ පෞද්ගලික අවස්ථා දෙකෙහිදීම, වංචාව සහ දූෂණය ඇතුළු වූ මහජන උනන්දුව සහිත ගැටලු සම්බන්ධයෙන් වෙහෙස නොබලා කටයුතු කරන නිර්භීත සටන්කරුවක් වන ඔහු, එම කරුණු නිරාවරණය කිරීම උදෙසා තනිව කටයුතු කරමින් සහ මාධ්‍ය තුල විවිධ ප්‍රකාශනයන් මගින් අභෝසි කරමින් සහ ශ්‍රී ලංකා අධිකරණයන්හි සහ එහි අග්‍ර ස්ථානයන්හි මහජන යහපත උදෙසා වන අධිකරණ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා සෑම විටම අරමුදල් සම්පාදනය කරන ලද්දේ ඔහු විසිනි. වංචා සහ දූෂණයන්ගෙන් මිදී සමාජය පවිත්‍රතාව කරා රැගෙන යාම සඳහා, දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කරමින්, එහිදී පර්වතයක් මෙන් නොසැලී සෑම ප්‍රයත්නයක්ම දරා සිටිමින්, පරිපූර්ණත්වය වෙත හඹා යාමේ දී, ඒ සම්බන්ධයෙන් ඔහු විසින් දරනු ලැබිය හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබීය.

විමර්ශනයන් සිදු කිරීම සඳහා සහ සමස්ථ උපකාරක හරහා යමින් හඳුනා ගත යුතු ඕනෑම ප්‍රශ්නයක හෝ ගැටලුවක හරය වෙත ළඟා වීමට සහ ඕනෑම වංචනික ක්‍රියාවක් හෝ කාර්යයක් ඉතා සියුම් ලෙස ඉලක්ක කිරීම සඳහා සහ ඔවුන් සමූලෝත්පාටනය සඳහා පිළිතුරු සෙවීමට උපකාරී වන දැඩි බුද්ධියක් සහ තියුණු මනසක් ඔහු සතුව පවතී.

ඔහු විසින් භාර ගන්නා කාර්යයන් සම්බන්ධ ඒකාග්‍රතාවය සහ පිළිගැනීම සමඟ වන විශිෂ්ට වෘත්තීමය හැකියාවන් ඔහු සතුව පවතී. පසුගිය වර්ෂ දහහතකට වඩා වැඩි කාලයක් බොහෝ නීතිමය කරුණු සම්බන්ධයෙන් මා සමඟ කටයුතු කර ඇති තැනැත්තෙකු වශයෙන්, ඔහු පිළිබඳ මාගේ පෞද්ගලික දැනුවත්භාවය අනුව, මා මේ සම්බන්ධයෙන් සහතික වන්නෙමි.

මනා සදාචාරාත්මක චරිත ස්වභාවයක් ඔහු සතුය.



මා ඔහු නිර්දේශ කරමි.

කේ. කනග්-ඊෂ්වරන්
ජනාධිපති නීතිඥ
කොමසාරිස්, ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව